# ශ්‍රම විගමනය පිළිබඳ හැඳින්වීමක්

## කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීම සඳහා වූ අත්පොත

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

(විදේශ රැකියා අංශය)

ශ්‍රී ලංකාව

2023

International Labour Organization

HELVETAS SRI LANKA

Schweizerische Eidgenossenschaft
Confédération suisse
Confederazione Svizzera
Confederaziun svizra

Swiss Agency for Development and Cooperation SDC

# කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීම සඳහා වූ අත්පොත

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

(විදේශ රැකියා අංශය)

ශ්‍රී ලංකාව

2023

# අන්තර්ගතය


| | | |
|---|---|---|
| අත්පොතට හැඳින්වීමක් | | ix |
| මොඩියුල හා සැසි | | |
| පුහුණු වැඩසටහන පිළිබඳ හැඳින්වීම | | xiv |
| 1 වන මොඩියුලය | : ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමනය පිළිබඳ අවබෝධයක් | 1 |
| | 1 වන සැසිය : ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමනය | 1 |
| | 2 වන සැසිය : ශ්‍රී ලාංකීය සමාජයට ශ්‍රම විගමණයේ ධනාත්මක සහ ඍණාත්මක බලපෑම | 3 |
| 2 වන මොඩියුලය | : ශ්‍රම විගමණය පිළිබඳ ජාත්‍යන්තර කැපවීම් | 4 |
| | 1 වන සැසිය : ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර කැපවීම් | 4 |
| | 2 වන සැසිය : ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ගෝලීය සංසද | 5 |
| | 3 වන සැසිය : ශ්‍රම සංක්‍රමණයට අදාළ ගෝලීය රාමු | 6 |
| 3 වන මොඩියුලය | : ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුව | 7 |
| | 1 වන සැසිය : ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුව | 7 |
| 4 වන මොඩියුලය | : ශ්‍රම විගමණ ක්‍රියාවලිය පාලනය | 9 |
| | 1 වන සැසිය : ශ්‍රම විගමණයට අදාළ ශ්‍රී ලංකාවේ නීති සහ රෙගුලාසි | 9 |
| | 2 වන සැසිය : ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමණය පිළිබඳ ආයතනික රාමුව | 10 |
| | 3 වන සැසිය : ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්යභාරය, වගකීම සහ සේවාවන් | 11 |
| 5 වන මොඩියුලය | : විවිධත්වයට සංවේදීතාව | 12 |
| | 1 වන සැසිය : ස්ත්‍රී පුරුෂ භාවය, වාර්ගිකත්වය, භූගෝලීය විවිධත්වය, ළමා ආරක්ෂාවල ආබාධිතභාවය සහ ආගමික විවිධත්වය පිළිබඳ හැඳින්වීමක්. | 12 |
| | 2 වන සැසිය : ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ භාවය සහ ශ්‍රම විගමණය | 13 |
| | 3 වන සැසිය : ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය (GBV), සංක්‍රමණික සේවකයා කෙරෙහි එල්ලවන බලහත්කාර ශ්‍රමය ඇතුළු ස්ත්‍රී පුරුෂ සමාජභාවීය බලපෑම සහ සංක්‍රමණික සේවකයා හා ගෘහස්ත ප්‍රචණ්ඩත්වය සහ ආයතනික හිංසනය | 14 |
| 6 වන මොඩියුලය | : සුරක්ෂිත ශ්‍රම විගමණය | 15 |
| | 1 වන සැසිය : ශ්‍රම විගමණ ක්‍රියාවලියේ අවධීන් පිළිබඳ මූලික දැනුම | 15 |
| | 2 වන සැසිය : ශ්‍රම විගමනය පිළිබඳ තීරණ ගැනීම | 16 |
| | 3 වන සැසිය : ශ්‍රම විගමනය පිළිබඳ තීරණ ගැනීම | 17 |

4 වන සැසිය : විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් බඳවා ගැනීමේ ක්‍රියාවලිය
විදේශ රැකියා සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලිය
සුරක්ෂිත ශ්‍රම විගමණය සඳහා නීත්‍යානුකූල මාර්ග 18

5 වන සැසිය : ගමනාන්තයේ ප්‍රධාන රටවල සමාජ-සංස්කෘතික අංශ, නීති සහ භාවිතයන් 19

6 වන සැසිය : ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින් විගමණයේ විවිධ අවස්ථා වලදී මුහුණ දෙන ගැටළු සහ දුෂ්කරතා 20

7 වන සැසිය : ගමනාන්ත රටවල ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවල කාර්යභාරය 21

8 වන සැසිය : නැවත ඒකාබද්ධ කිරීමේ උප ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලැස්ම (කණ්ඩායම් වැඩ) ක්‍රියාත්මක කිරීමේදී DO-FE හි කාර්යභාරය 22

7 වන මොඩියුලය : දුක්ගැනවිලි විසඳීම 23

1 වන සැසිය : SLBFE හි ගැටළු විසඳීම සහ පැමිණිලි හැසිරවීමේ යාන්ත්‍රණ 23

8 වන මොඩියුලය : ආර්ථික සහ මූල්‍ය අංශ 25

1 වන සැසිය : ශ්‍රම විගමණයේ වැදගත්කම 25

2 වන සැසිය : මූල්‍ය සාක්ෂරතාවය සහ ප්‍රේෂණ කළමනාකරණය 26

9 වන මොඩියුලය : සංක්‍රමණ සෞඛ්‍යය 27

1 වන සැසිය : සෑම අදියරකදීම විගමණික ශ්‍රමිකයන් මුහුණ දෙන සෞඛ්‍ය ගැටලු 27

10 වන මොඩියුලය : සන්නිවේදනය, මිතුරු වීම සහ සහාය ලබා දීම 29

1 වන සැසිය : විගමණික ශ්‍රමිකයා අවබෝධ කර ගැනීම 29

2 වන සැසිය : සන්නිවේදන කුසලතා හැඳින්වීම 30

3 වන සැසිය : සුමිතුරු වීම පිළිබඳ හැඳින්වීම 31

11 වන මොඩියුලය : විදේශ රැකියා සංවර්ධන නිලධාරියෙකු ලෙස සේවය කිරීම 32

1 වන සැසිය : DO-FE හි භූමිකාවන් සහ වගකීම් 32

12 වන මොඩියුලය : සිද්ධි කළමනාකරණය 33

1 වන සැසිය : අවදානම තේරුම් ගැනීම 33

2 වන සැසිය : සිද්ධි කළමනාකරණය 34

3 වන සැසිය : රැකවරණ සැලැස්ම 35

13 වන මොඩියුලය : සමාප්තිය 36

1 වන සැසිය : ඉගෙනීම සහ ඇගයීම නැවත බැලීම 36

වැඩිදුර අධ්‍යයනය සඳහා 37

# අත්පොතට හැඳින්වීමක්

## ඉලක්කය හා අරමුණ

මෙම අත්පොත, විගමණික ශ්‍රමිකයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට ඵලදායී හා කාර්යක්ෂම සේවා සැපයීම සඳහා විදේශ රැකියා අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරීන්ගේ දැනුම තොරතුරු පදනම සහ ධාරිතාවය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රම විගමනය, සුරක්ෂිත ශ්‍රම විගමනය සහ එහි විවිධ පැතිකඩ පිළිබඳ පුහුණු වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම අරමුණු කර ගෙන ඇත.

- මෙම අත්පොත විදේශ රැකියා සංවර්ධන නිලධාරීන්ට පුහුණුව ලබා දෙන පුහුණුකරුවන්/සම්පත් දායකයින් විසින් මාර්ගෝපදේශයක් ලෙස භාවිතා කිරීමට නියමිතය.
- මෙම පුහුණු අත්පොත ලඅත්පොතෙහි ආවරණය වන විෂයයන් පිළිබඳ තොරතුරු සහ දැනුම සපයන සම්පත් පැකේජය සමඟ කියවිය යුතුවේ.
- ප්‍රාදේශීය මට්ටමින් සංවර්ධන නිලධාරීන් (විදේශ රැකියා) ලෙස ක්‍රියා කිරීම සඳහා පුහුණුකරුවන්/සම්පත් දායකයින් සඳහා පුළුල් පුහුණුවක් ලබා දීම සඳහා මෙම අත්පොත පරිශීලක-හිතකාමී ආකාරයෙන් සකස් කර ඇත.

## පුහුණු අත්පොත පිළිබඳ විස්තරයක්

- පුහුණු අත්පොත දින 7ක (පැය 45.5 ක පුහුණු වැඩසටහනක් සඳහා වේ.)
- අත්පොත සැලසුම් කර ඇත්තේ පුහුණු වැඩසටහන අඛණ්ඩව දින 7 කින් හෝ කොටස් වශයෙන් (දින වෙන් කර ඇති පරිදි) පැවැත්වීමට හැකි වන පරිදි ය.
- පුහුණු අත්පොත ආසන්න වශයෙන් මොඩියුල 13 කින් සමන්විත වේ (පහත විස්තර කර ඇති පරිදි). පුහුණු අත්පොතෙහි ඇතුළත් විෂයයන් පිළිබඳ තොරතුරු සහ දැනුම සපයන සම්පත් පැකේජය සමඟ එය කියවිය යුතුය.
- සෑම සැසියක්ම පහත පරිදි සකසා ඇත:
  - සැසි අංකය සහ මාතෘකාව
  - සැසියේ අරමුණු
  - සැසියේ කාලසීමාව
  - සැසියේදී භාවිතා කළ යුතු ක්‍රියාකාරකම් සහ ක්‍රමවේදයන් පියවරෙන් පියවර ක්‍රියාවලියකින් පැහැදිලි කර ඇත
  - ඉගෙනීමේ ප්‍රතිඵල
  - එක් එක් සැසිවාරයේදී භාවිතා කළ යුතු සම්පත් පැකේජයට සෘජු සබැඳියක්.
  - සම්පත් ඇසුරුමක් සංවර්ධන නිලධාරීන්ට අත් පත්‍රිකා ලෙස ලබා දීමට නියමිතය.

## පුහුණු න්‍යායපත්‍රය

සෑම දිනකම උදේ 9 ට ආරම්භ වී සවස 5 ට අවසන් වේ. සෑම දිනකම පහත විරාමයන් වෙන් කරනු ලැබේ.

- විනාඩි 15 - උදෑසන තේ
- පැය 1 - දිවා ආහාරය
- විනාඩි 15 - සවස තේ

දෛනික පුහුණු න්‍යාය පත්‍රය පහත විස්තරකර ඇත:

| මොඩියුලය | සැසිය | පැය / විනාඩි | දින |
|---|---|---|---|
| හැඳින්වීම | පුහුණු වැඩසටහනට හැඳින්වීම | විනාඩි 45 | 1 |
| 1. ශ්‍රම විගමණය පිළිබඳ අවබෝධයක් | 1. ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමණය (ඉතිහාසය සහ වර්තමන් පැතිකඩ) | පැය 1 | |
| | 2. ශ්‍රම ශ්‍රම විගමණය සංක්‍රමණය ශ්‍රී ලාංකීය සමාජය කෙරෙහි ඇති කරන ධනාත්මක සහ ඍණාත්මක බලපෑම | විනාඩි 30 | |
| 2. ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර බැඳීම් ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර කැපවීම් | ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ප්‍රධාන ජාත්‍යන්තර සම්මුතීන් | විනාඩි 60 | |
| | ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ගෝලීය සංසද | විනාඩි 20 | |
| | ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ගෝලීය රාමු | විනාඩි 45 | |

| මොඩියුලය | සැසිය | පැය / විනාඩි | දින |
|---|---|---|---|
| 3. ශ්‍රම විගමණය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති රාමුව | ශ්‍රම විගමණය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති රාමුව | පැය 1 විනාඩි 30 | 2 |
| | ජාතික ශ්‍රම විගමණය ප්‍රතිපත්තිය 2008 | | |
| | විගමණික ශ්‍රමිකයින් ආපසු පැමිණීම සහ නැවත ඒකාබද්ධ කිරීම පිළිබඳ උප ප්‍රතිපත්ති සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම.2015 | | |
| | තාක්ෂණික අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2018 | | |
| 4. ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමණය පාලනය | ශ්‍රම විගමණයට අදාළ ශ්‍රී ලංකා නීති සහ රෙගුලාසි<br>SLBFE පනත<br>ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමණය පිළිබඳ ආයතනික රාමුව<br>ශ්‍රම විගමණයට අදාළ වෙනත් රාජ්‍ය මූලික රාමු සහ ව්‍යුහයන්<br>ශ්‍රම විගමණ අංශයේ අනෙකුත් කැපී පෙනෙන ලක්ෂණ | විනාඩි 30 | |
| | SLBFE හි කාර්යභාරයන් සහ වගකීම් සහ සේවාවන් | පැය 2 | |
| 5. විවිධත්වයට සංවේදීතාව | ස්ත්‍රී පුරුෂ භාවය, වාර්ගිකත්වය, භූගෝලීය විවිධත්වය, ළමා ආරක්ෂාවල ආබාධිතභාවය, ආගමික විවිධත්වය පිළිබඳ හැඳින්වීමක් | විනාඩි 90 | |
| | ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ශ්‍රම විගමණය | විනාඩි 90 | |
| 6. සුරක්ෂිත ශ්‍රම සංක්‍රමණය | ශ්‍රම විගමණ ක්‍රියාවලියේ අවධීන් පිළිබඳ මූලික දැනුම | විනාඩි 45 | |
| | සුරක්ෂිත ශ්‍රම විගමණයේ පියවර | විනාඩි 45 | |
| | ශ්‍රම විගමණය පිළිබඳ තීරණ ගැනීම | විනාඩි 30 | |
| | බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය | පැය 1 | |
| | ගමනාන්තයේ ප්‍රධාන රටවල සමාජ-සංස්කෘතික අංශ | විනාඩි 45 | 3 |
| | ශ්‍රම විගමණයේ විවිධ අවස්ථා වලදී විගමණික සේවකයින් මුහුණ දෙන ගැටළු / දුෂ්කරතා | පැය 1 විනාඩි 30 | |
| | ගමනාන්ත රටවල ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවල කාර්යභාරය | විනාඩි 45 | |
| | ආපසු පැමිණීම සහ නැවත ඒකාබද්ධ කිරීම (කණ්ඩායම් වැඩ) පිළිබඳ උප ප්‍රතිපත්තියේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී DOFE හි කාර්යභාරය | විනාඩි 30 | |
| 7. දුක්ගැනවිලි ගැටළු විසඳීම | SLBFE හි දුක්ගැනවිලි විසඳීමේ /ගැටළු විසඳීම සහ පැමිණිලි හැසිරවීමේ යාන්ත්‍රණය<br>වෙනත් දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණ | පැය 2 | 4 |

| මොඩියුලය | සැසිය | පැය / විනාඩි | දින |
|---|---|---|---|
| 8. ආර්ථික හා මූල්‍ය අංශ | ශ්‍රම විගමණයේ වැදගත්කම<br>මූල්‍ය සාක්ෂරතාව සහ ප්‍රේෂණ කළමනාකරණය | පැය 2 | 5 |
| 9. සංක්‍රමණ සෞඛ්‍යය | සෑම අදියරකදීම විගමණික ශ්‍රමිකයින් මුහුණ දෙන සෞඛ්‍ය ගැටලු<br>සංක්‍රමණ සෞඛ්‍ය ප්‍රතිපත්තිය<br>ශ්‍රම විගමණයට COVID-19 වසංගතයේ බලපෑම | පැය 1<br>විනාඩි 30 | |
| 10. විගමණික ශ්‍රමිකයා අවබෝධ කර ගැනීම, සන්නිවේදනය, සුමිත්‍රත්වය සහ සහාය ලබා දීම | විගමණික ශ්‍රමිකයා අවබෝධ කර ගැනීම, සන්නිවේදනය, සුමිත්‍රත්වය සහ සහාය ලබා දීම | පැය 1 | |
| | සන්නිවේදන කුසලතා හැඳින්වීම | විනාඩි 45 | |
| | සුමිත්‍රත්වය පිළිබඳ හැඳින්වීම | විනාඩි 45 | |
| 11. DOFE ලෙස වැඩ කිරීම | DOFE හි භූමිකාවන් සහ වගකීම්- රැකියා විස්තරය පිළිබඳ සාකච්ඡාව | විනාඩි 45 | 6 |
| 12. සිද්ධි කළමනාකරණය | අවදානම තේරුම් ගැනීම | පැය 1 | |
| | සිද්ධිකළමනාකරණය | පැය 1<br>විනාඩි 30 | 7 |
| | රැකවරණ සැලැස්ම | පැය 1<br>විනාඩි 30 | |
| 13. සමාප්තිය | ඇගයීම | විනාඩි 30 | |

## පුහුණුකරුවන්ට උපදෙස් කිහිපයක්

- මෙම අත්පොත සමඟ පවත්වනු ලබන පුහුණු වැඩසටහනකට සහභාගිවිය යුතු සුදුසුම සංඛ්‍යාව විසිදෙනෙකු (20) විය යුතුය.
- සැසි පැවැත්වීමට පෙර අවශ්‍යය සියලු ද්‍රව්‍ය සූදානම් කරන්න.
- කාලය සහ අන්තර්ගතය නොවෙනස්ව තබා ගනිමින් ඔබට ඕනෑම කොටසක ක්‍රමවේදය වෙනස් කළ හැක.
- ඔබට කැමති පරිදි කණ්ඩායම් කටයුතු එකතු කළ හැක.
- ඔබට පිළිතුරු සැපයිය නොහැකි සියලුම ප්‍රශ්න සහ ගැටළු ලියාතැබීමට, "Parking Space" ලෙස සලකුණු කර ඇති ෆ්ලිප්චාට් එකක් සපයන්න . ඒසේම සම්පත් දායකයින් පුහුණුවට සහභාගී වන විට ඔවුන් ගේ සහාය ලබා ගන්න. පුහුණු වැඩමුළුව අවසන් කිරීමට පෙර මෙම සියලු ප්‍රශ්න සහ ගැටළු වලට පිළිතුරු සොයා ගැනීමට මතක තබා ගන්න. "Parking Space" තුළ ලියා ඇති ගැටළු සාකච්ඡා කරන විට සටහන් තබා ගැනීමට සහභාගිවන්නන් දිරිමත් කරන්න.

**ඔබට අවශ්‍ය විය හැකි ද්‍රව්‍ය ලැයිස්තුව**

- සියලුම විනිවිද
- Power point
- Flipcharts
- ටේප්
- කඩදාසි
- පෑන්

# පුහුණු වැඩසටහන පිළිබඳ හැඳින්වීම

| | | |
|---|---|---|
| මාතෘකාව | : | පුහුණු වැඩසටහන පිළිබඳ හැඳින්වීම |
| අරමුණ | : | සහභාගිවන්නන් වැඩමුළුවේ අරමුණු අවබෝධ කර ගැනීම, සම-සහභාගිවන්නන් සමඟ මිත්‍රශීලී සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම සහ වැඩමුළුවෙන් සහභාගිවන්නන්ගේ අපේක්ෂාව අවබෝධ කර ගැනීමට ඔවුන්ට පහසුකම් සැලසීම. |
| කාලය | : | විනාඩි 45 යි |
| සැසියේ විස්තරය | : | මෙම සැසිය මගින් පුහුණුකරුවන්, සහභාගිවන්නන් සහ පුහුණු වැඩසටහන හඳුන්වා දීමට පහසුකම් සැලසේ. |

## ක්‍රියාකාරකම් සහ ක්‍රමවේදයː

- පහසුකම් සපයන්නා ලෙස ඔබව හඳුන්වා දෙන්න (ඔබේ වෘත්තීය සහ අධ්‍යාපනික පසුබිම, රැකියාව සහ වත්මන් වැඩ සහ පුහුණුවල විගමණය පිළිබඳ පළපුරුද්ද හෝ දැනුම සඳහන් කරන්න)
- වර්තමානයේ, විගමණික ශ්‍රමික අයිතීන් පිළිබඳව කටයුතු සඳහා ඔබගේ නියැලීම හඳුන්වා දෙන්න.
- පුහුණු වැඩසටහනේ අරමුණ සහ අන්තර්ගතය පිළිබඳ දළ විශ්ලේෂණයක් සැපයීම.
- වැඩසටහන ආරම්භයේ සිටම කතා කිරීමට සහභාගිවන්නන් දිරිමත් කිරීම සඳහා සහභාගිවන්නන්ට තමන්ව හඳුන්වා දීම සඳහා පහත ක්‍රියාකාරකම භාවිතා කරන්න.

## යුගල සහභාගිවන්නන්ː

එක් සහභාගිවන්නෙකුගෙන් අනෙකාගෙන් තොරතුරු රැස් කිරීමට ඉල්ලා සිටින්න. එම තොරතුරු, සේවා ස්ථානය, ඔහු/ඇය, ඔහුගේ/ඇයගේ ප්‍රධාන කාර්යයන් සහ ඔහු/ඇය සේවය කරන කොට්ඨාශය පිළිබඳ තොරතුරු විය යුතුය. ඊළඟට සෑම යුගලයකටම තමන් දැන් කතා කළ අනෙක් පුද්ගලයා හඳුන්වා දෙන ලෙස ඉල්ලා සිටින්න.

- සහභාගිවන්නන් සමඟ එක්ව වැඩමුළුව පවත්වන කාලය තුළ පිළිපැදිය යුතු මූලික නීති සකස් කරන්න
- ඊළඟට වැඩමුළුව සහ/හෝ සැසිවලදී අවධානය යොමු කිරීම පිළිබඳව සහභාගි වන්නන්ට සිතීමට සලස්වා ගැනීම සඳහා විගමණික සේවකයින් විශේෂයෙන් මුහුණ දෙන ගැටලුවක් සඳහා එක් උදාහරණයක් ලබා දෙන ලෙස සහභාගිවන්නන් කිහිප දෙනෙකුගෙන් (5-6) ඉල්ලා සිටින්න..

## අත් පත්‍රිකා

සම්පූර්ණ පුහුණු වැඩසටහන සඳහා හෝ දින එකක්/දෙකක්/තුනක් සඳහා න්‍යාය පත්‍රය (වැඩසටහන පවත්වන ආකාරය අනුව)



**මාතෘකාව** : **ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමනය**

**අරමුණ** : රටට විදේශ රැකියා අංශයේ වැදගත්කම පිළිබඳව සහ වත්මන් තත්ත්වය හා ශ්‍රම විගමණයේ ප්‍රවණතා පිළිබඳව අවබෝධයක් විදේශ රැකියා සංවර්ධන නිලධාරීන්ට ලබා දීම.

**කාලය** : පැය 1 යි

**සැසිය පිළිබඳ විස්තරය** : මෙම සැසිය ඊළඟ සැසි සඳහා පසුබිම සකස් කරනු ඇත. පහත සඳහන් දෑ ඇතුළුව ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමනයේ වත්මන් තත්ත්වය මෙම සැසිවාරයේදී සාකච්ඡා කරනු ඇත.

- ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ රටේ දළ දේශීය නිෂ්පාදිතයට දායක වීම
- ශ්‍රමිකයන්ගේ විගමනයේ මෑත කාලීන ප්‍රවණතා
- රැකියා වර්ගවල වෙනස්කම්, විදේශ රැකියාවේ නිපුණතා මට්ටම් සහ කාන්තාවන් සහ පිරිමින්ගේ සහභාගීත්වය.
- ප්‍රතිපත්ති සහ නීති සම්පාදනයේදී වැදගත්වන කරුණු.

මෙම සැසිවාරයෙන් පහත සඳහන් කරුණු පිළිබඳ සංඛ්‍යානමය නියෝජනය සහ විශ්ලේෂණය ඇතුළුව ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමණය පිළිබඳ වත්මන් තත්ත්වය පිළිබඳ කෙටි විස්තරයක් ලබා දෙනු ඇත.

- ශ්‍රම විගමනයේ පිරිමි සහ කාන්තා සහභාගීත්වය
- කාන්තා ශ්‍රමික විගමනයේ ප්‍රවණතාවය අඩුවීම සහ වෙනස්කම් සඳහා හේතු
- කුසලතා මට්ටම් සහ රැකියා වර්ග
- ආර්ථිකයට ශ්‍රමික ප්‍රේෂණවල වැදගත්කම

## ක්‍රියාකාරකම් සහ ක්‍රමවේදය

- මෙම සැසියේ අරමුණ පිළිබඳව සහභාගිවන්නන් දැනුවත් කිරීම සහ සහභාගිවන්නන් විසින් සැසිය අවසානයේ පිළිතුරු දිය යුතු ප්‍රශ්න 4 ක් සපයන්න.
- ලබා දී ඇති පවර් පොයින්ට් ස්ලයිඩ් භාවිතා කරමින්, ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමනයේ වත්මන් පැතිකඩ ඉදිරිපත් කරන්න.
- සහභාගිවන්නන් හතර දෙනෙකු අහඹු ලෙස තෝරා සපයන ලද ප්‍රශ්න හතරට පිළිතුරු අසන්න.

  ප්‍රශ්න :

  - ☐ ද ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමනයේ කාන්තා ශ්‍රමික විගමනය අඩුවීමට ප්‍රධාන හේතු තුනක් හඳුනා ගන්න
  - ☐ ද අනෙකුත් ප්‍රධාන අපනයන ආදායම සමඟ ශ්‍රමික ප්‍රේෂණ ප්‍රවාහය සැසඳීමක් කරන්න

- ද කාන්තාවන්ට විශේෂිත වූ සහ පිරිමින්ට විශේෂිත වූ ලක්ෂණ විශ්ලේෂණය කරමින් ශ්‍රම විගමනය ක්‍රියාවලියේදී කාන්තාවන් සහ පිරිමින් (වෙනම) සහභාගී වීම පිළිබඳව අදහස් දක්වන්න.

**සම්පත් පැකේජයට යොමුව:**

- ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමනය

**අවශ්‍ය ද්‍රව්‍යය:**

- බහුමාධ්‍යය උපකරණ
- විනිවිදක ඉදිරිපත් කිරීම



| | | |
|---|---|---|
| මාතෘකාව | : | **ශ්‍රී ලාංකීය සමාජයට ශ්‍රම විගමණයේ ධනාත්මක සහ ඍණාත්මක බලපෑම** |
| අරමුණ | : | ශ්‍රම විගමණයේ විවිධ බලපෑම් අවබෝධ කර ගැනීම. |
| කාලය | : | විනාඩි 30 |
| සැසිය පිළිබඳ විස්තරය | : | විගමණික ශ්‍රමිකයන් ට, ඔවුන්ගේ පවුල්වලට සහ විශාල වශයෙන් රටට, ශ්‍රම විගමණයෙන් ඇති වන ධනාත්මක සහ ඍණාත්මක බලපෑම පිළිබඳ සාකච්ඡාව උත්තේජනය කිරීමට මෙම සැසිය උත්සාහ කරයි. ශ්‍රම විගමණය පිළිබඳ බොහෝ විට ඔවුන් ඍණාත්මක ලෙස විනිශ්චය කරන නමුදු, ධනාත්මක සහ ඍණාත්මක යන දෙඅංශයේම විවිධ බලපෑම් සහභාගිවන්නන් තේරුම් ගනු ඇත. |

## ක්‍රියාකාරකම් සහ ක්‍රමවේදය

- සහභාගිවන්නන් කණ්ඩායම් හතරකට බෙදන්න.
- කණ්ඩායම් 1 සහ 2 ශ්‍රම විගමණයේ ධනාත්මක අංශ සාකච්ඡා කර වාර්තා කිරිම
- කණ්ඩායම් 3 සහ 4 ශ්‍රම විගමණයේ ඍණාත්මක පැති සාකච්ඡා කර වාර්තා කිරිම
- කණ්ඩායම් විසින් ධනාත්මක සහ ඍණාත්මක බලපෑම් වාර්තා කිරීමෙන් පසුවල කණ්ඩායම් 1 සහ 2 කණ්ඩායම් අතර 3 සහ 4 කණ්ඩායම්වලට එරෙහිව අනෙකාගේ කරුණු වලට අභියෝග කරමින් විවාදයක් පැවැත්වීම.
- විවාදය අවසන් වූ පසු, ගොඩනැගි කරුණු ඒකාබද්ධ කර ශ්‍රම විගමණයේ බලපෑම්හි සංකීර්ණත්වය ප්‍රදර්ශනය කරන්න

## සම්පත් පැකේජයට යොමුව:

- කරුණු සහ සංඛ්‍යා, සහ කථාන්තර සමග ධනාත්මක බලපෑම් ලැයිස්තුව
- කරුණු සහ සංඛ්‍යා, සහ කථාන්තර සමග ඍණාත්මක බලපෑම් ලැයිස්තුව

## අවශ්‍යය ද්‍රව්‍යය:

- Flipcharts
- පෑන්

| | |
|---|---|
| මාතෘකාව | : ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර කැපවීම් |
| සැසියේ අරමුණ | : ශ්‍රම සංක්‍රමණයට අදාළ ප්‍රධාන සම්මුතීන් පිළිබඳ කෙටි හැඳින්වීමක් සැපයීම. |
| කාලය | : විනාඩි 60 |
| සැසිය පිළිබඳ විස්තරය | : මෙම සැසිය සහභාගිවන්නන්ට ශ්‍රම සංක්‍රමණයට අදාළ ජාත්‍යන්තර සම්මුතීන් පිළිබඳ කෙටි හැඳින්වීමක් ලබා දෙනු ඇත. මෙම සැසිවාරය සම්මුතීන් සඳහා ශ්‍රී ලංකාව දක්වන කැපවීම් පසුබිම් කර ගත් විශ්ලේෂණාත්මක ස්වභාවයකින් යුක්ත වනු ඇත. |

- ශ්‍රම සංක්‍රමණයට අදාළ ILO සම්මුතීන්
- රැකියා සඳහා සංක්‍රමණය සම්මුතිය (සංශෝධිත), 1949 (අංක 97)
- සංක්‍රමණික ශ්‍රමිකයින් (පරිපූරක ප්‍රතිපාදන) සම්මුතිය, 1975 (අංක 143)
- ගෘහ සේවක සම්මුතිය, 2011 (අංක 189)
- ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර කිරීම් පිළිබඳ සම්මුතිය, 2019 (අංක 190)

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

වැඩමුළුවට පෙර සහභාගිවන්නන්ට ජාත්‍යන්තර කැපවීම් පිළිබඳ රූප සටහනක් සමඟ අත් පත්‍රිකාවක් ලබා දීම සහ පරිශීලනය සඳහා අන්තර්ගතය කියවන ලෙස සහභාගිවන්නන්ගෙන් ඉල්ලා සිටිම.

## සම්පත් පැකේජයට යොමුව:

- ජාත්‍යන්තර කැපවීම් පිළිබඳ රූප සටහන නිරූපණය කරන අත් පත්‍රිකා
- විනිවිදක
- එක් එක් සම්මුතිය පිළිබඳ (එක් පිටුවක) තොරතුරු පත්‍රිකාව
- සංක්‍රමණික ශ්‍රමිකයින් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතීන් (පිටු දෙකක අත් පත්‍රිකාව)
- සම්මුතිවල සම්පූර්ණ වාර්ථාව ( රූප සටහන මත පදනම්ව එක් එක් සම්මුතිය පිළිබඳ ඉදිරිපත් කිරීමක් කිරීම)

## අවශ්‍ය ද්‍රව්‍ය:

- බහුමාධ්‍ය උපකරණ
- flipcharts

මාතෘකාව : ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ගෝලීය සංසද

සැසියේ අරමුණ : ශ්‍රම සංක්‍රමණ ක්‍රියාවලිය තුළ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කරන ගෝලීය සහ කලාපීය මට්ටමින් වන සංසද අවබෝධ කර ගැනීම

කාලය : විනාඩි 20 යි

සැසිය පිළිබඳ විස්තරය : මෙම සැසියේදී සංක්‍රමණ සහ සංවර්ධනය පිළිබඳ ගෝලීය සංසදය, සංක්‍රමණ සෞඛ්‍ය පිළිබඳ ගෝලීය උපදේශනය, කොළඹ ක්‍රියාවලිය, අබුඩාබි සංවාදය සහ බාලි ක්‍රියාවලිය හඳුන්වා දෙනු ඇත.

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- සහභාගිවන්නන් කණ්ඩායම් 6 කට බෙදන්න
- ජාත්‍යන්තර කැපවීම් පිළිබඳ රූප සටහනක් සමග කියවීමට පහත පරිදි සටහනක් සපයන්න.
- කණ්ඩායම් 1 සහ 2: සංක්‍රමණ සහ සංවර්ධනය පිළිබඳ ගෝලීය සංසදය, සංක්‍රමණ සෞඛ්‍යය පිළිබඳ ගෝලීය උපදේශනය පිළිබඳ සටහන සාකච්ඡා කරන්න.
- කණ්ඩායම් 3 සහ 4: කොළඹ ක්‍රියාවලිය පිළිබඳ සටහන සාකච්ඡා කරන්න,
- කණ්ඩායම් 5 සහ 6: අබුඩාබි සංවාදය සහ බාලි ක්‍රියාවලිය පිළිබඳ සටහන සාකච්ඡා කරන්න
- සපයා ඇති ආයතනික ව්‍යුහය භාවිතා කරමින්, එක් එක් ආයතනය ශ්‍රම සංක්‍රමණ ක්‍රියාවලියට සම්බන්ධ වන ආකාරය සාකච්ඡා කරන්න .

## සම්පත් පැකේජයට යොමුව:

- සංක්‍රමණය සහ සංවර්ධනය පිළිබඳ ගෝලීය සංසදයේ සටහන
- සංක්‍රමණ සෞඛ්‍යය පිළිබඳ ගෝලීය උපදේශනය
- කොළඹ ක්‍රියාවලිය පිළිබඳ සටහන
- අබුඩාබි සංවාදය පිළිබඳ සටහන
- බාලි ක්‍රියාවලිය පිළිබඳ සටහන
- ආයතනික ව්‍යුහය
- එක් එක් සංසදය සඳහා වෙබ් අඩවි වෙත යොමු

## අවශ්‍ය ද්‍රව්‍ය:

- බහුමාදිය උපකරණ හෝ flipcharts
- ආයතනික ව්‍යුහය අනුව විශේෂඥයන් සකස් කළ විනිවිදකය



| | | |
|---|---|---|
| මාතෘකාව | : | ශ්‍රම සංක්‍රමණයට අදාළ ගෝලීය රාමු<br>■ තිරසාර සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රය<br>■ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) |
| සැසියේ අරමුණ | : | සංක්‍රමණය, විශේෂයෙන්ම තිරසාර සංවර්ධන ඉලක්ක සහ ආරක්ෂිත, ක්‍රමවත් සහ විධිමත් සංක්‍රමණය සඳහා වන ගෝලීය සම්මුතිය පිළිබඳ ගෝලීය රාමු පිළිබඳ අවබෝධයක් ලබා දීම |
| කාලය | : | විනාඩි 45 යි |
| සැසිය පිළිබඳ විස්තරය | : | මෙම සැසිය තිරසාර සංවර්ධන ඉලක්ක කෙරෙහි අවධානය යොමු කරන අතර සංක්‍රමණය කෙරෙහි වන ඉලක්ක සඳහා සෘජුවම අවධානය යොමු කරනු ඇත. විශේෂයෙන් ඉලක්ක 10.7, 8.8, ඉලක්ක 5, 16 සහ 17. ඉහත සියලු තිරසාර සංවර්ධන ඉලක්ක හරහා ප්‍රවර්ධනය කරන ලද යහපත් වැඩ පිළිබඳ සංකල්පය සාකච්ඡා කරන්න. ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණයේ සියලුම අංග සහතික කරන සහ අරමුණු 23 කින් සමන්විත රාමුව අනුගමනය කිරීම ප්‍රවර්ධනය කරන ආරක්ෂිත, ක්‍රමවත් සහ විධිමත් සංක්‍රමණය සඳහා වූ ගෝලීය සම්මුතිය පිළිබඳව ද මෙම සැසිවාරයේදී සාකච්ඡා කෙරේ. |

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- පුහුණු වැඩසටහනට පෙර සහභාගිවන්නන්ට තිරසාර සංවර්ධන ඉලක්ක සහ GCM පිළිබඳ සටහනක් ලබා දීම සහ අන්තර්ගතය කියවන ලෙස සහභාගිවන්නන්ගෙන් ඉල්ලා සිටින්න.

පුහුණු වැඩසටහනේදී,

- සහභාගිවන්නන් කණ්ඩායම් 2කට බෙදන්න.
- පහත සඳහන් සටහන් කණ්ඩායම් සඳහා සපයන්න:
- කණ්ඩායම් 1 තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ සටහන
- 2 කාණ්ඩය -සුරක්ෂිත, ක්‍රමවත් සහ විධිමත් සංක්‍රමණය සඳහා ගෝලීය සම්මුතිය
- සටහනේ අන්තර්ගතය විනාඩි 5-10 අතර කාලයක් සාකච්ඡා කිරීමට සෑම කණ්ඩායමකටම උපදෙස් දෙන්න..
- ඉහත ගෝලීය රාමු, ඒවා ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණ යාන්ත්‍රණය සහ ක්‍රියාත්මක කිරීමේ වත්මන් තත්ත්වය පිළිබඳව ඉදිරිපත් කිරීමක් කිරීම.
- ප්‍රශ්න සහ සාකච්ඡා සඳහා විවෘත කරන්න

## සම්පත් පැකේජයට යොමුව:

- තිරසාර සංවර්ධන ඉලක්ක සහ සුරක්ෂිත, ක්‍රමවත් හා විධිමත් සංක්‍රමණය සඳහා වන ගෝලීය සම්මුතිය පිළිබඳ සටහන්.
- ඉදිරිපත් කිරීමේ විනිවිදක
- සම්පූර්ණ පාඨය

## අවශ්‍ය ද්‍රව්‍ය:

- බහුමාධ්‍ය උපකරණ හෝ flipcharts
- විශේෂයෙන් සකස් කළ විනිවිදක

| | |
|---|---|
| මාතෘකාව | : **ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුව**<br>■ ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2008<br>■ ශ්‍රී ලංකාවේ විගමණික ශ්‍රමිකයින් ආපසු පැමිණීම සහ නැවත ඒකාබද්ධ කිරීම පිළිබඳ උප ප්‍රතිපත්තිය සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම<br>■ තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, 2018<br>■ යාවත්කාලීන කරන ලද ජාතික ප්‍රතිපත්තිය සහ රැකියා සඳහා විගමණය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (යෝජිත) 2022-2026 |
| සැසියේ අරමුණ | : ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ශ්‍රම විගමණය පිළිබඳ අනෙකුත් අදාළ ජාතික ප්‍රතිපත්තීන් පිළිබඳ අවබෝධයක් ලබා දීම |
| කාලය | : විනාඩි 60 යි |
| සැසිය පිළිබඳ විස්තරය | : 2008 ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, නැවත ඒකාබද්ධ කිරීමේ උප ප්‍රතිපත්තිය සහ රැකියා සඳහා විගමණය පිළිබඳ යාවත්කාලීන කළ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳ කෙටි හැඳින්වීමක් සැපයීම කෙරෙහි මෙම සැසිවාරය අවධානය යොමු කරනු ඇත. මෙම ප්‍රතිපත්ති සම්පාදනය කරන ලද ආකාරය මෙන්ම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අධීක්ෂණ යාන්ත්‍රණය සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ වත්මන් තත්ත්වයද සැසියට ඇතුළත් වේ. |

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- පුහුණු වැඩසටහනට පෙර, සහභාගිවන්නන්ට ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුව පිළිබඳ සටහනක් ලබා දීම සහ එහි අන්තර්ගතය පළමුවෙන් කියවන ලෙස සහභාගිවන්නන්ගෙන් ඉල්ලා සිටීම.

පුහුණු වැඩසටහනේදී,

- සහභාගිවන්නන් කණ්ඩායම් 6 කට කොටස් කරන්න.
- පහත සඳහන් දෑ කණ්ඩායම් සඳහා සපයන්න:
    - කණ්ඩායම් 1 සහ 2 - ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳ සටහන
    - කණ්ඩායම් 3 සහ 4 - ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමණිකයින් නැවත සමාජගත කිරීමේ උප ප්‍රතිපත්තිය පිළිබඳ සටහන
    - 5 සහ 6 කණ්ඩායම් - 2018 තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳ සටහන
- සටහනේ අන්තර්ගතය විනාඩි 5-10 අතර කාලයක් සාකච්ඡා කිරීමට සෑම කණ්ඩායමකටම උපදෙස් දෙන්න.

- ප්‍රතිපත්තින්, ඒවා ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණ යාන්ත්‍රණය සහ ක්‍රියාත්මක කිරීමේ වත්මන් තත්ත්වය පිළිබඳව ඉදිරිපත් කිරීමක් කරන්න.
- ප්‍රශ්න සහ සාකච්ඡා සඳහා විවෘත කරන්න.

**සම්පත් පැකේජයට යොමුව:**

- ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, නැවත ඒකාබද්ධ කිරීමේ උප ප්‍රතිපත්තිය සහ සංක්‍රමණ සෞඛ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ සටහන්
- ඉදිරිපත් කිරීමේ විනිවිදක
- ප්‍රතිපත්තින් හී සම්පූර්ණ පාඨ

**අවශ්‍ය ද්‍රව්‍ය:**

- බහුමාදිය උපකරණ හෝ flipcharts
- විශේෂයෙන් සකස් කළ විනිවිදක



| | |
|---|---|
| මාතෘකාව | : ශ්‍රම විගමණයට අදාළ ශ්‍රී ලංකාවේ නීති සහ රෙගුලාසි |
| සැසියේ අරමුණ | : රැකියා සහ සංචලනය සඳහා ඇති අයිතිය, ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමණයට අදාළ නීතිය සහ ශ්‍රම විගමණය පිළිබඳ ප්‍රධාන රෙගුලාසි පිළිබඳ අවබෝධයක් ලබා දීම. |
| කාලය | : විනාඩි 30 යි |
| සැසිය පිළිබඳ විස්තරය | : මෙම සැසියේදී කාන්තාවන්ට සහ පිරිමින්ට අදාළ වන රැකියා සහ සංචලනය සඳහා ව්‍යවස්ථානුකූල අයිතිය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පනත සහ පවුල් පසුබිම් වාර්තාවට අදාළ නියාමන පසුබිම පිළිබඳව අවධානය යොමු කෙරේ. |

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- පහත සඳහන් දේ පිළිබඳ ඉදිරිපත් කිරීමක් කරන්න:
- රැකියා සහ සං චලනය සඳහා ඇති අයිතිය පිළිබඳ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත
- පවුල් පසුබිම් වාර්තාව
- මේ සමඟ විවෘත සාකච්ඡාවක් පැවැත්වීම සහ ප්‍රශ්න මත පදනම් සාකච්ඡාව

## සම්පත් පැකේජයට යොමුව:

- රැකියා සහ සංචලනය සඳහා ව්‍යවස්ථානුකූල අයිතිය පිළිබඳ සටහන
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පනතේ ප්‍රධාන විධිවිධාන පිළිබඳ සටහන
- පවුල් පසුබිම් වාර්තාවේ සටහන
- විනිවිදක ඉදිරිපත් කිරීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වගන්තින් හි සම්පූර්ණ වාර්තාවල ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පනත සහ පවුල් පසුබිම් වාර්තාව

## අවශ්‍ය ද්‍රව්‍ය

- බහුමාදිය උපකරණ හෝ flipcharts
- විශේෂයෙන් සකස් කළ විනිවිදක

| | |
|---|---|
| මාතෘකාව | : **ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමණය පිළිබඳ ආයතනික රාමුව** |
| සැසියේ අරමුණ | : ශ්‍රම විගමණය පිළිබඳව කටයුතු කරන විවිධ ආයතනවල කාර්යභාරය සහ කාර්යයන් අවබෝධ කර ගැනීම |
| කාලය | : පැය 2 යි |
| සැසිය පිළිබඳ විස්තරය | : මෙම සැසිවාරය කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය පිළිබඳ අවබෝධයක් ලබා දෙනු ඇත<br><br>(දැක්ම, මෙහෙවර, අරමුණු, අංශ සහ ඒවායේ කාර්යයන්, මධ්‍යම, දිස්ත්‍රික් සහ කොට්ඨාශ), ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (දැක්ම, මෙහෙවර, අරමුණු, අංශ සහ ඒවායේ කාර්යයන්, මධ්‍යම, දිස්ත්‍රික් සහ කොට්ඨාශ), කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම, සෞඛ්‍ය අමාත්‍යාංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවල විදේශ කටයුතු අමාත්‍යාංශය (කොන්සියුලර් අංශය) සහ ශ්‍රම විගමණයට අදාළ වෙනත් රාජ්‍ය මූලික රාමු සහ ව්‍යුහයන්<br><br>■ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය<br>■ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය<br>■ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,<br>■ විදේශ කටයුතු අමාත්‍යාංශය (කොන්සියුලර් අංශය)<br>■ විදේශ රැකියා නියෝජිතායතන<br>■ උප නියෝජිතයන් |

**සම්පත් පැකේජයට යොමුව:**

- කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය පිළිබඳ සටහන
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පිළිබඳ සටහන
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව පිළිබඳ සටහන,
- විදේශ කටයුතු අමාත්‍යාංශය පිළිබඳ සටහන (කොන්සියුලර් අංශය)
- විදේශ රැකියා නියෝජිතායතන පිළිබඳ සටහන
- උප නියෝජිතයන් පිළිබඳ සටහන
- විනිවිදක
- වෙබ් අඩවි සහ සම්බන්ධ විය යුතු පුද්ගලයින් සඳහා යොමු

**අවශ්‍ය ද්‍රව්‍ය :**

- බහුමාධ්‍ය උපකරණ හෝ flipcharts
- විශේෂයෙන් සකස් කළ විනිවිදක

| | |
|---|---|
| **මාතෘකාව** | : **ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්යභාරය, වගකීම සහ සේවාවන්** |
| **සැසියේ අරමුණ** | : ශ්‍රම විගමණය පිළිබඳවකටයුතු කරන විවිධ ආයතනවල කාර්යභාරය සහ කාර්යයන් අවබෝධ කර ගැනීම |
| **කාලය** | : පැය 2 යි |
| **සැසිය පිළිබඳ විස්තරය** | : මෙම සැසිවාරයේදී විදේශ රැකියා අමාත්‍යාංශය (දැක්ම, මෙහෙවර, අරමුණු, අංශ සහ ඒවායේ කාර්යයන්, මධ්‍යම, දිස්ත්‍රික් සහ කොට්ඨාශ පැමිණීම), ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (දැක්ම, මෙහෙවර, අරමුණු, අංශ සහ ඒවායේ කාර්යයන් පිළිබඳ අවබෝධයක් ලබා දෙනු ඇත., මධ්‍යම, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය පැවැත්ම), කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවල විදේශ කටයුතු අමාත්‍යාංශය (කොන්සියුලර්) ශ්‍රම සංක්‍රමණයට අදාළ වෙනත් රාජ්‍ය මූලික රාමු සහ ව්‍යුහයන්, බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතයන්. |

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- පහත කරුණු පිළිබඳව ඉදිරිපත් කිරීමක් කිරීමට සම්පත් දායකයෙකුට ආරාධනා කරන්න:
- විදේශ රැකියා අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා විදේශ කාර්යාංශය
- ආගමන විගමන දෙපාර්තමේන්තුව
- විදේශ කටයුතු අමාත්‍යාංශය (කොන්සියුලර් අංශය)
- රැකියා නියෝජිතයන් - විදේශ රැකියා නියෝජිතායතන
- උප නියෝජිතයන්
- ප්‍රශ්න පිළිබඳව විවෘත සාකච්ඡාවක් පැවැත්වීම සහ ප්‍රශ්න මත පදනම්ව අදහස් ප්‍රකාශයට ඉඩ දීම

## සම්පත් පැකේජයට යොමුව:

- කම්කරු අමාත්‍යාංශය පිළිබඳ සටහන
- රැකියා නියෝජිතයන් - විදේශ රැකියා නියෝජිතායතන
- උප නියෝජිතයන්

## අවශ්‍ය ද්‍රව්‍ය

- බහුමාදිය උපකරණ හෝ flipcharts
- විශේෂයෙන් සකස් කළ විනිවිදක

| | |
|---|---|
| මාතෘකාව | : **ස්ත්‍රී පුරුෂ භාවය, වාර්ගිකත්වය, භූගෝලීය විවිධත්වය, ළමා ආරක්ෂාවල ආබාධිතභාවය සහ ආගමික විවිධත්වය පිළිබඳ හැඳින්වීමක්.** |
| සැසියේ අරමුණ | : ශ්‍රී ලාංකේය සමාජය තුළ පවතින සමාජ විවිධත්වයට සංවේදී වීමේ අවශ්‍යතාවය පිළිබඳ හැඳින්වීමක් සැපයීම |
| කාලය | : පැය 1 විනාඩි 30 යි |
| සැසිය පිළිබඳ විස්තරය | : මෙම සැසිය සමාජ විවිධත්වය පිළිබඳ හඳුන්වාදීමේ දර්ශනයක් සපයන අතර පහත සඳහන් දෑ ඇතුළත් වනු ඇත: |

- ස්ත්‍රී පුරුෂ භාවය, ශ්‍රම විගමණ ක්‍රියාවලියේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇති කරන වෙනස සහ ස්ත්‍රී පුරුෂ අසමානතාවයෙන් පැන නගින ගැටළු
- වාර්ගික විෂමතා සහ ආගමික විවිධත්වය සහ වාර්ගික කණ්ඩායම් මුහුණ දෙන ගැටළු

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- විනිවිදක මත පදනම් වූ කෙටි ඉදිරිපත් කිරීම් වලින් පසුව ක්‍රියාකාරී සාකච්ඡාවක්

## සම්පත් පැකේජයට යොමුව:

- වාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, භූගෝලීය විවිධත්වය, ළමා ආරක්ෂාවල ආබාධිතභාවය, ආගමික විවිධත්වය පිළිබඳ අත්පත්‍රිකා

## අවශ්‍ය ද්‍රව්‍ය:

- විනිවිදක

| | |
|---|---|
| මාතෘකාව | : **ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ භාවය සහ ශ්‍රම විගමණය** |
| සැසියේ අරමුණ | : ශ්‍රී ලාංකේය සමාජය තුළ පවතින සමාජ විවිධත්වයට සංවේදී වීමේ අවශ්‍යතාවය පිළිබඳ හැඳින්වීමක් සැපයීම |
| කාලය | : පැය 1 විනාඩි 30 යි |
| සැසිය පිළිබඳ විස්තරය | : මෙම සැසිය සමාජ විවිධත්වය පිළිබඳ හඳුන්වාදීමේ දර්ශකයක් සපයන අතර පහත සඳහන් දෑ ඇතුළත් වනු ඇත: |

- ස්ත්‍රී පුරුෂ භාවය, ශ්‍රම විගමණ ක්‍රියාවලියේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇති කරන වෙනස සහ ස්ත්‍රී පුරුෂ අසමානතාවයෙන් පැන නගින ගැටළු
- වාර්ගික විෂමතා සහ ආගමික විවිධත්වය සහ වාර්ගික කණ්ඩායම් තුන මුහුණ දෙන ගැටළු
- ශ්‍රී ලංකාවේ පළාත්වලට විශේෂිත වූ ගැටළු සහ වතුකරය වැනි භූගෝලීය වශයෙන් වෙන් වූ ස්ථානවල ඣීවත් වන ආන්තික කණ්ඩායම් සහ දරිද්‍රතාවයට යටත් ප්‍රජාවන් වැනි භූගෝලීය විෂමතා
- ළමා ආරක්ෂාව පිළිබඳ ගැටළු
- ආබාධිතභාවය සහ විගමණික ශ්‍රමිකයනට සහ ඔවුන්ගේ පවුල්වලට එහි බලපෑම්

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- විනිවිදක මත පදනම් වූ කෙටි ඉදිරිපත් කිරීම් වලින් පසුව ක්‍රියාකාරී සාකච්ඡාවක්

## සම්පත් පැකේජයට යොමුව:

- වාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, භූගෝලීය විවිධත්වය, ළමා ආරක්ෂාවල ආබාධිතභාවය, ආගමික විවිධත්වය පිළිබඳ අත්පත්‍රිකා

## අවශ්‍ය ද්‍රව්‍ය

- විනිවිදක



| | | |
|---|---|---|
| මාතෘකාව | : | **ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය (GBV), සංක්‍රමණික සේවකයා කෙරෙහි එල්ලවන බලහත්කාර ශ්‍රමය ඇතුළු ස්ත්‍රී පුරුෂ සමාජභාවීය බලපෑම සහ සංක්‍රමණික සේවකයා හා ගෘහස්ත ප්‍රචණ්ඩත්වය සහ ආයතනික හිංසනය.** |
| සැසියේ අරමුණ | : | සංක්‍රමණික සේවකයා මුහුණදෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන තත්වයන් පිළිබඳ හැඳින්වීමක් සැපයීම |
| කාලය | : | පැය 1 විනාඩි 30 යි |
| සැසිය පිළිබඳ විස්තරය | : | මෙම සැසිය ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය (GBV) පිළිබඳව අවබෝධයක් සපයන අතර පහත සඳහන් දෑ ඇතුළත් වනු ඇත:<br>■ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන ආකාරයන්<br>■ සංක්‍රමණික සේවකයා කෙරෙහි එල්ලවන බලහත්කාර ශ්‍රමය ඇතුළු ගැටළු සහ එහි ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පසුබිම<br>■ සංක්‍රමණික සේවකයා හා ගෘහස්ත ප්‍රචණ්ඩත්වය සහ ආයතනික හිංසනය. |

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- විනිවිදක මත පදනම් වූ කෙටි ඉදිරිපත් කිරීම් වලින් පසුව ක්‍රියාකාරී සාකච්ඡාවක්

## සම්පත් පැකේජයට යොමුව:

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය, සංක්‍රමණික සේවකයා කෙරෙහි එල්ලවන ගෘහස්ත ප්‍රචණ්ඩත්වය සහ ආයතනික හිංසනය සහ බලහත්කාර ශ්‍රමය පිළිබඳ අත්පත්‍රිකා.

## අවශ්‍ය ද්‍රව්‍ය:

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳ පරිගණකමය ඉදිරිපත් කිරීම (සම්පත් පැකේජය හා අමුණා ඇත)

| | | |
|---|---|---|
| මාතෘකාව | ː | ශ්‍රම විගමණ ක්‍රියාවලියේ අවධීන් පිළිබඳ මූලික දැනුම |
| සැසියේ අරමුණ | ː | ශ්‍රම විගමණ ක්‍රියාවලියේ විවිධ අවස්ථා අවබෝධ කර ගැනීම |
| කාලය | ː | විනාඩි 45 යි |
| සැසිය පිළිබඳ විස්තරය | ː | මෙම සැසිය සහභාගිවන්නන්ට ශ්‍රම විගමණයේ සෑම අදියරකදීම විශේෂයෙන් ඇතුළත් කර ඇති දේ සහ එක් එක් අදියර අනෙකෙන් වෙනස් වන්නේ කෙසේද යන්න පිළිබඳ අවබෝධයක් ලබා දෙනු ඇත. |

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- විගමණ ක්‍රියාවලියේ ප්‍රධාන අවධීන් හතරට ඇතුළත් කර ඇති දේ කෙටියෙන් පැහැදිලි කරන්න.
- සහභාගිවන්නන්ට කණ්ඩායම් 4 කට බෙදී එක් එක් අදියරෙහි ඇතුළත් කර ඇති දේ විස්තර කිරීමට ඉඩදීම
  - 1 කණ්ඩායම - තීරණ ගැනීමේ අදියර
  - කණ්ඩායම 2 - පෙර පිටත්වීමේ අදියර
  - 3 කණ්ඩායම - සේවා අවධියේ (මෙරට සිටින පවුල් ඇතුළුව)
  - 4 කණ්ඩායම - ආපසු පැමිණීම සහ නැවත ඒකාබද්ධ කිරීමේ අදියර
- ඔවුන්ගේ කරුණු ඉදිරිපත් කිරීමට සහ සාකච්ඡා කිරීමට කණ්ඩායම්වලට උපදෙස් දෙන්න..

## සම්පත් පැකේජයට යොමුවː

- ශ්‍රම විගමණ ක්‍රියාවලියේ අදියරවල රූප සටහන
- ශ්‍රම විගමණ ක්‍රියාවලියේ අදියර හතර පිළිබඳ සටහන්

## අවශ්‍ය ද්‍රව්‍ය

- Flipcharts



| | | |
|---|---|---|
| මාතෘකාව | : | ශ්‍රම විගමනය පිළිබඳ තීරණ ගැනීම |
| සැසියේ අරමුණ | : | සුරක්ෂිත ශ්‍රම විගමණයේ සංකල්පීය හා ප්‍රායෝගික පැති තේරුම් ගැනීම |
| කාලය | : | විනාඩි 45 යි |
| සැසිය පිළිබඳ විස්තරය | : | මෙම සැසිය සුරක්ෂිත ශ්‍රම විගමන මාර්ගෝපදේශය මත පදනම් වේ. සුරක්ෂිත ශ්‍රම විගමනයට අවශ්‍ය දේ, විගමණයේ විවිධ අවස්ථා වලදී සුරක්ෂිත ශ්‍රම විගමනය පිළිබඳව ප්‍රායෝගික උපදෙස් සහ පුද්ගලයින්ගේ සුරක්ෂිත ශ්‍රම විගමනය සහතික කිරීම සඳහා මෙවලමක් එමඟින් ලබා දෙනු ඇත. |

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- සුරක්ෂිත ශ්‍රම විගමනය යනු කුමක්දැයි පිළිබඳ ඉදිරිපත් කිරීමක් කරන්න
- ශ්‍රම සංක්‍රමණයේ අදියර හතර මත පදනම්ව කණ්ඩායම් හතරකට සහභාගිවන්නන් ශ්‍රම සංක්‍රමණයේ අදියර හතරේදී සුරක්ෂිත විගමණය සහතික කිරීම සලකා බැලිය යුතු වැදගත් කරුණු සාකච්ඡා කිරීම
- කණ්ඩායම් ඉදිරිපත් වන පරිදි, සුරක්ෂිත ශ්‍රම විගමන මාර්ගෝපදේශයේ අන්තර්ගතය මත පදනම්ව අතුරුදහන් වූ සියලුම තොරතුරු එක් කරන්න.
- සුරක්ෂිත ශ්‍රම විගමනය පිරික්සුම් ලැයිස්තුව ඉදිරිපත් කර පිරික්සුම් ලැයිස්තුව සම්පූර්ණ කරන ආකාරය පිළිබඳ උපදෙස් සපයන්න
- සුරක්ෂිත ශ්‍රම විගමන මාර්ගෝපදේශය



| | |
|---|---|
| මාතෘකාව | : ශ්‍රම විගමනය පිළිබඳ තීරණ ගැනීම |
| සැසියේ අරමුණ | : තීරණ ගැනීමේ ප්‍රායෝගික පැති තේරුම් ගැනීම |
| කාලය | : විනාඩි 30 යි |
| සැසිය පිළිබඳ විස්තරය | : මෙම සැසිවාරය මගින් කාන්තාවන් සහ පිරිමින් විසින් වෙන් වෙන්ව සහ ඉතිරි වූවන්ගේ පවුල් සහ භාරකරුවන් විසින් ප්‍රායෝගිකව තීරණ ගැනීම සඳහා අවශ්‍ය දේ ගවේෂණය කිරීමට හැකියාව ලැබේ. මෙම සැසිය පුහුණු සහ අඩු කුසලතා යන සියලු වර්ගවල ශ්‍රම විගමනිකයින් මාර්ගෝපදේශයේ කෙරෙහි අවධානය යොමු කරනු ඇත. |

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- කණ්ඩායම් සහභාගිවන්නන් 3 කට සකස් කරන්න.
- රැකියා සඳහා විගමණය වීම පිළිබඳ දැනුවත් තීරණ ගැනීමට ශ්‍රමික අපේක්ෂකයන්ට උපකාර කිරීමට අවශ්‍ය ප්‍රායෝගික කරුණු සාකච්ඡා කිරීමට කණ්ඩායම්වලට උපදෙස් දීම. මෙම කරුණු පිරිමි සහ ගැහැණු සඳහා වෙන වෙනම හඳුනාගත යුතුය.
- නෛතික, නියාමන සහ පරිපාලන අංශ, මනෝ සමාජීය අංශ, මූල්‍ය අංශ සහ දුක්ගැනවිලි සහ ඒවාට විසඳුම් ඇතුළුව සලකා බැලිය යුතු ගැටළු පිළිබඳ කණ්ඩායම් වැඩ සඳහා උපදෙස් සැපයීම.
- කණ්ඩායම් සාකච්ඡා ඉදිරිපත් කිරීම

## සම්පත් පැකේජයට යොමුව:

- රැකියා සඳහා විගමණය වීමට තීරණය කිරීමේදී කාන්තාවන් සහ පිරිමින් විසින් සලකා බැලිය යුතු කරුණු න්‍යාසය

## අවශ්‍ය ද්‍රව්‍ය :

- Flipcharts

| | | |
|---|---|---|
| මාතෘකාව | : | විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් බඳවා ගැනීමේ ක්‍රියාවලිය<br>විදේශ රැකියා සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලිය<br>සුරක්ෂිත ශ්‍රම විගමණය සඳහා නීත්‍යානුකූල මාර්ග |
| සැසියේ අරමුණ | : | රැකියා සඳහා සංක්‍රමණය වන විට අනුගමනය කරන බඳවා ගැනීමේ පටිපාටිය පිළිබඳ අවබෝධයක් ලබා දීම. |
| කාලය | : | පැය 1 යි |
| සැසිය පිළිබඳ විස්තරය | : | රැකියා සඳහා සංක්‍රමණය කිරීමේදී අනුගමනය කරන බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය මෙන්ම අඩුපාඩු, හිඩැස් සහ අනතුරු පිළිබඳව පියවරෙන් පියවර අවබෝධයක් මෙම සැසිය මඟින් ලබා දෙනු ඇත. |

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- කණ්ඩායම් හතරකට සහභාගිවන්නන් සකස් කරන්න.
- ශ්‍රම විගමණය සඳහා බඳවා ගැනීම් සඳහා පියවරෙන් පියවර මාර්ගෝපදේශය ඉදිරිපත් කිරීමට කණ්ඩායම්වලට සාකච්ඡා කිරීමට ඉඩ දෙන්න.
- සම්පත් පැකේජයේ සපයා ඇති රූප සටහන භාවිතා කරමින් “බඳවා ගැනීමේ ක්‍රියාවලිය” පිළිබඳ පියවරෙන් පියවර මාර්ගෝපදේශය ඇතුළුව ඉදිරිපත් කිරීමක් කරන්න.
- නැවත විමසා බැලීම සඳහා කණ්ඩායම් යොමු කරන්න.

## සම්පත් පැකේජයට යොමුව:

- බඳවා ගැනීම් සඳහා පියවරෙන් පියවර මාර්ගෝපදේශය - අත් පත්‍රිකාව
- විනිවිදක

## අවශ්‍ය ද්‍රව්‍ය

- Flipcharts
- පෑන්

| | |
|---|---|
| මාතෘකාව | : ගමනාන්තයේ ප්‍රධාන රටවල සමාජ-සංස්කෘතික අංශ, නීති සහ භාවිතයන් |
| සැසියේ අරමුණ | : ශ්‍රී ලාංකීය විගමණික ශ්‍රමිකයින් සේවය කරන ප්‍රධාන ගමනාන්ත රටවල සමාජ-සංස්කෘතික අංශයන් පිළිබඳ දළ විශ්ලේෂණයක් සැපයීම. |
| කාලය | : විනාඩි 45 යි |
| සැසිය පිළිබඳ විස්තරය | : ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් ප්‍රධානවශයෙන් ගමනාන්ත 4කට සංක්‍රමණය වේ. එනම් සෞදි අරාබිය, කුවේට්, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ කටාර් ය. අනෙකුත් වැදගත් ගමනාන්ත වන්නේ බහරේන්, ඕමාන් ජෝර්දානය, ලෙබනනය වේ. එක් එක් රටෙහි ප්‍රධාන නගරය, ජනගහනය, ආර්ථිකය, භාෂා, ආගම, විදේශගත ශ්‍රමිකයන් ඇතුළු විදේශිකයන්ගේ තත්ත්වය, ඇඳුම් පැළඳුම්, කලාව සහ විනෝදාස්වාදය, ක්‍රීඩාවල ආහාර පිසීම, අධ්‍යාපනය සහ සමාජීය ගැටලු පිළිබඳව මෙම සැසිවාරය මඟින් අවබෝධයක් ලබා දෙනු ඇත. |

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- ගූගල් සිතියමක් මත රට සොයා ගැනීම සහ පින්තූර සහ ඡායාරූප මාලාවක් භාවිතා කරමින් සහභාගිවන්නන්ට එක් එක් සංරචක පැහැදිලි කරන්න.

## සම්පත් පැකේජයට යොමුව:

- Google සෙවුම
- පැහැදිලි කිරීමේ පෙළ සහිත පින්තූර සහ ඡායාරූප
- රටවල්හි තොරතුරු පොත් පිංච

## අවශ්‍ය ද්‍රව්‍ය

- බහුමාදිය උපකරණ



| | |
|---|---|
| මාතෘකාව | : **ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින් විගමණයේ විවිධ අවස්ථා වලදී මුහුණ දෙන ගැටළු සහ දුෂ්කරතා** |
| සැසියේ අරමුණ | : විගමණික ශ්‍රමිකයින්ට පෙර පිටත්වීමේදී, සේවයේදී සහ ආපසු පැමිණීමේදී සහ නැවත ඒකාබද්ධ කිරීමේදී මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳව DOFE අතර චින්තනය ජනනය කිරීම සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සපයනු ලබන සේවාවන් හඳුනා ගැනීම. |
| කාලය | : පැය 1 විනාඩි 15 |
| සැසිය පිළිබඳ විස්තරය | : මෙම සැසිය මගින් විගමණිකයා මුහුණ දෙන ගැටළු සහ ගැටළු පිළිබඳව සිතීම උත්තේජනය කරනු ඇත |

- ශ්‍රම විගමණිකයන් සහ ඔවුන්ගේ පවුල්වලට පෙර පිටත්වීමේදී, සේවයේ යෙදී සිටින විට, සහ නැවත ඒකාබද්ධ කිරීමේ අදියරදී ඔවුන්ගේ එක් එක් අත්දැකීම් අනුව අත්විඳින ලද ගැටළු 5ක් කාඩ්පත් මත ලිවීමට එක් එක් සහභාගී වන්නෙකුගෙන් ඉල්ලා සිටින්න
- පෙර පිටත්වීම, සේවයේ, සහ ආපසු පැමිණෙන ලෙස සලකුණු කර ඇති ෆ්ලිප්චාර්ට් තුනක කාඩ්පත් තබන්න
- නැවත ඒකාබද්ධ කිරීම ඊළඟ සැසියේදී සාකච්ඡා කිරීමට flipchart එක තබා ගන්න
- දුක්ගැනවිලි නිරාකරණය මත කණ්ඩායම් සහභාගිවන්නන් 3 කට බෙදන්න. සේවයේ යෙදී සිටින flipchart සඳහා සහභාගී වන්නන් /කණ්ඩායම් වලට කාඩ්පත් තුනකට බෙදන්න.
- කණ්ඩායම් /සහාගිවන්නන් 4 කට බෙදෙන ලෙස දන්වා එක් කාඩ් කට්ටලයක් ලබා දෙන්න
- කාඩ්පත්වල ලියා ඇති එක් එක් ගැටළු ගෙන විශ්ලේෂණයක් සැපයීමට කණ්ඩායම්වලට උපදෙස් දෙන්න

පහත සඳහන් යටතේ ඇති එක් එක් ගැටළු:

- මෙම දුෂ්කරතාව/ගැටලුව හෝ ගැටලුව මතුවීමට හේතු මොනවාද?
- මෙම ගැටලුව ශ්‍රමිකයින්ට, ඇයගේ/ඔහුගේ පවුලට ඇති කරන බලපෑම් මොනවාද?
- දුෂ්කරතා/ගැටලුව හෝ ගැටලුව සඳහා විසඳුම් මොනවාද?
- විසඳුම ලබාදිය හැක්කේ කාටද? ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සපයනු ලබන සේවාවන් තෝරන්න

## අවශ්‍ය ද්‍රව්‍ය

- Flipcharts සහ සලකුණු පෑන්

| | |
|---|---|
| මාතෘකාව | : ගමනාන්ත රටවල ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවල කාර්යභාරය |
| සැසියේ අරමුණ | : ගමනාන්ත රටවල ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවල කාර්යභාරය සහ සේවාවන් පිළිබඳ අවබෝධයක් ලබා දීම |
| කාලය | : විනාඩි 45 යි |
| සැසිය පිළිබඳ විස්තරය | : මෙම සැසිය සහභාගිවන්නන්ට ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවල පහත සඳහන් කරුණු පිළිබඳ අවබෝධයක් ලබා දෙනු ඇත. |

- විගමනික ශ්‍රමිකයින් සඳහා වගකිව යුතු නිලධාරීන්
- එමගින් සපයනු ලබන සේවාවන්
- දූත මණ්ඩලයේ සේවාවන් වෙත ප්‍රවේශ වන්නේ කෙසේද?

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- විනිවිදක භාවිතා කරමින්, අයිතම 1-3 පිළිබඳ ඉදිරිපත් කිරීමක් කරන්න.
- එක් එක් අයිතමය යටතේ ඉදිරිපත් කිරීම අනුගමනය කරමින්, රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සමඟ කටයුතු කිරීමේදී ඇති වූ සාර්ථකත්වයන් සහ දුෂ්කරතා පිළිබඳව DO-FE හි අත්දැකීම් මත පදනම්ව සාකච්ඡාවක් ඇති කරන්න.

## සම්පත් පැකේජයට යොමුව:

- විනිවිදක
- සාකච්ඡා උත්තේජනය කිරීමට ප්‍රශ්න

## අවශ්‍ය ද්‍රව්‍ය

- බහුමාධ්‍ය උපකරණ හෝ flipcharts
- විශේෂයෙන් සකස් කළ විනිවිදක

| | |
|---|---|
| මාතෘකාව | : **නැවත ඒකාබද්ධ කිරීමේ උප ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලැස්ම (කණ්ඩායම් වැඩ) ක්‍රියාත්මක කිරීමේදී DO-FE හි කාර්යභාරය** |
| සැසියේ අරමුණ | : නැවත ඒකාබද්ධ කිරීමේ උප ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී DO-FE හි කාර්යභාරය පිළිබඳ සාකච්ඡාව සහ අවබෝධය උත්පාදනය කිරීම. |
| කාලය | : විනාඩි 30 යි |
| සැසිය පිළිබඳ විස්තරය | : නැවත ඒකාබද්ධ කිරීමේ උප ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී ඔවුන්ගේ කාර්යභාරය සහ SLBFE කරන්නේ කුමක්ද යන්න පිළිබඳව DO-FE අතර සාකච්ඡාවක් මෙම සැසිය මගින් ජනනය කරනු ඇත. |

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- කණ්ඩායම් සහභාගිවන්නන් 4 කට සකස් කිරීම
- නැවත ඒකාබද්ධ කිරීමේ උප ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලැස්ම නැවත බැලීම සඳහා සෑම කණ්ඩායමකටම පැවසීම සහ නැවත ඒකාබද්ධ කිරීමට අයත් සියලුම ක්‍රියාමාර්ග අනුව DO-FE කරන්නේ කුමක්ද යන්න ලැයිස්තුගත කරන්න.
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ප්‍රතිසංවිධානය කිරීමේදී කරන්නේ කුමක්ද යන්න පිළිබඳව ඉදිරිපත් කිරීමක් කරන්න.
- නැවත ඒකාබද්ධ කිරීමේ උප ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා ඔවුන්ට කළ හැකි තවත් දේ හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ කාර්යය නැවත බැලීමට කණ්ඩායම් යොමුකරන්න.

## සම්පත් පැකේජයට යොමුව:

- නැවත ඒකාබද්ධ කිරීමේ උප ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලැස්ම

## අවශ්‍ය ද්‍රව්‍ය

- අත් පත්‍රිකා

මාතෘකාව : **SLBFE හි ගැටළු විසඳීම සහ පැමිණිලි හැසිරවීමේ යාන්ත්‍රණ**

සැසියේ අරමුණ : ගැටලුවක් විසඳීමේ පියවර පිළිබඳ අවබෝධයක් ලබා දීම

SLBFE විසින් සපයනු ලබන දුක්ගැනවිලි විසඳීමේ සේවාවන් පිළිබඳ අවබෝධයක් ලබා දීම

විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල් මුහුණ දෙන ගැටළු විසඳීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් පිටත පවතින වෙනත් දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයන්.

කාලය : පැය 2 යි

සැසිය පිළිබඳ විස්තරය : මෙම සැසිය දෙකොටසකින් යුතු වනු ඇත.

- 1 වන කොටස වනුයේ විගමනික ශ්‍රමිකයින් සහ/හෝ ඔවුන්ගේ පවුල්වල සහ භාරකරුවන් විසින් ගෙන එන ගැටලුවක් සමඟ කටයුතු කිරීමේදී සහ විසඳීමට උත්සාහ කිරීමේදී ගත යුතු පියවර පිළිබඳ අවබෝධයක් ලබා දීමයි.
- 2 වන කොටස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සමථ ඒකකය, එහි පැමිණිලි භාර ගැනීමේ ක්‍රියාවලිය, අනුගමනය කරන ලද සමථ ක්‍රියාවලිය සහ පවතින සේවාවන් සහ පිළියම් පිළිබඳ අවබෝධයක් ලබා දෙනු ඇත.
- රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශයේ යාන්ත්‍රණ, මානව හිමිකම් කොමිෂන් සභාවල නීති ආධාර කොමිෂන් සභාවල සමථ මණ්ඩල වැනි රාජ්‍ය අංශයේ යාන්ත්‍රණ, කාන්තා කටයුතු හා ළමා සංවර්ධන අමාත්‍යාංශය තුළ ඇති යාන්ත්‍රණ, පොලිසිය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල යාන්ත්‍රණ සහ සිවිල් සමාජ යාන්ත්‍රණ .

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- දුක්ගැනවිලි පිළිබඳ සිද්ධි අධ්‍යයනයන් භාවිතා කරමින් සහභාගිවන්නන් විගමණික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල් විසින් ඔවුන් වෙත ගෙන එන දුක්ගැනවිලි විසඳන ආකාරය පිළිබඳව සහභාගිවන්නන් සමඟ සාකච්ඡා කිරීම
- ගැටලුවක් විසඳීමේ පියවර ඉදිරිපත් කිරීමක් කරන්න
- SLBFE හි සමථ ඒකකය, එහි පැමිණිලි භාර ගැනීමේ ක්‍රියාවලිය, අනුගමනය කරන ලද සමථ ක්‍රියාවලිය සහ පවතින සේවාවන් සහ පිළියම් පිළිබඳව ඉදිරිපත් කිරීමක් කරන්න.
- ප්‍රශ්න සහ පිළිතුරු සැසියකට පහසුකම් සැලසීම

## සම්පත් පැකේජයට යොමුව:

- ගැටලුවක් විසඳීමට පියවර
- SLBFE හි සමථ ඒකකය පිළිබඳ අත් පත්‍රිකාව
- අත් පත්‍රිකාව:

- මානව හිමිකම් කොමිසම
- නීති ආධාර කොමිෂන් සභාව
- සමථ මණ්ඩල
- කාන්තා කටයුතු සහ ළමා සංවර්ධන අමාත්‍යාංශය තුළ යාන්ත්‍රණ
- පොලිසිය
- ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල යාන්ත්‍රණ
- සිවිල් සමාජ යාන්ත්‍රණ

| | |
|---|---|
| **මාතෘකාව** | : **ශ්‍රම විගමණයේ වැදගත්කම** |
| **සැසියේ අරමුණ** | : විගමණික ශ්‍රමිකයන් විසින් ආර්ථිකයට කරනු ලබන දායකත්වය අවබෝධ කර ගැනීම |
| **කාලය** | : පැය 1 යි |
| **සැසිය පිළිබඳ විස්තරය** | : මෙම සැසියේදී විගමණික ශ්‍රමයේ වටිනාකම සහ විගමණික ශ්‍රමිකයන් රටට සහ ඔවුන්ගේ පවුල්වලට ආර්ථික දායකත්වය ලබා දීම පිළිබඳව අවධානය යොමු කරනු ඇත. මෙම සැසිය උත්සාහ කරන්නේ පවුල් ප්‍රතිලාභ අනුව ශ්‍රම විගමණයේ ධනාත්මක බව දෙස සහභාගිවන්නන් බැලීමට සැලැස්වීමයි |

- ආදායම් මාර්ගයක් ලෙස ප්‍රේෂණ
- ජාතික ආර්ථිකයට ප්‍රේෂණ මත ඇති වන බලපෑම
- විගමණික ශ්‍රමිකයන් වෙත ප්‍රේෂණ මත ඇති කරන බලපෑම
- විගමණික ශ්‍රමික පවුල්වලට ප්‍රේෂණ මත ඇති වන බලපෑම

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- ආදායම් ප්‍රභවයක් ලෙස ප්‍රේෂණ පිළිබඳ සහ ජාතික ආර්ථිකයට ඇති බලපෑම සපයා ඇති විනිවිදක යොදා ගනිමින් කෙටි ඉදිරිපත් කිරීමක් කරන්න.
- කණ්ඩායම් දෙකකට සහභාගිවන්නන් වෙන් කරන්න.
- සෑම කණ්ඩායමකටම මාතෘකාවක් ලබා දී කණ්ඩායම් සාමාජිකයින්ට සාකච්ඡා කිරීමට සහ මාතෘකාව පිළිබඳ ඔවුන් දන්නා තොරතුරු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින්න. සෑම කණ්ඩායමක්ම පුද්ගල මට්ටමින්, පවුල් මට්ටමින්, ප්‍රජා මට්ටමින් සහ ජාතික මට්ටමින් කරන ලද දායකත්වය ඉදිරිපත් කළ යුතුය.
  - 1 කණ්ඩායම - පවුල් සවිබල ගැන්වීම / සුභසාධනය සඳහා විගමණික ශ්‍රමිකයන් විසින් සපයන ලද දායකත්වය සාකච්ඡා කරන්න
  - 2 කණ්ඩායම - තම පෞද්ගලික දියුණුව වෙනුවෙන් විගමණික ශ්‍රමිකයන් විසින් සපයන ලද දායකත්වය සාකච්ඡා කරන්න
- ඉදිරිපත් කිරීම් සාකච්ඡා කර සපයා ඇති කරුණු පිළිබඳ තොරතුරු එක් කරන්න.

## සම්පත් පැකේජයට යොමුවː

- ආදායම් මාර්ගයක් ලෙස ප්‍රේෂණ පිළිබඳ අත් පත්‍රිකාව සහ ජාතික ආර්ථිකයට ඇති බලපෑම.
- පවුල් සංවර්ධන සැලැස්ම

## අවශ්‍ය ද්‍රව්‍යː

- ජාතික ආර්ථිකයට ප්‍රේෂණවල බලපෑම පිළිබඳ විනිවිදක

| | | |
|---|---|---|
| මාතෘකාව | : | මූල්‍ය සාක්ෂරතාවය සහ ප්‍රේෂණ කළමනාකරණය |
| සැසියේ අරමුණ | : | ඔවුන්ගේ මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම සඳහා ප්‍රේෂණ භාවිතා කරන්නේ කෙසේද, විවිධ අවධීන් සඳහා ගෘහස්ථ මූල්‍ය ඉලක්ක සකසන්නේ කෙසේද යන්න තේරුම් ගැනීම. මූල්‍ය සාක්ෂරතා පුහුණුවේ අවසාන පරමාර්ථය වන්නේ ප්‍රේෂණවල වැදගත්කම සහ එය ඥානවන්තව කළමනාකරණය කරන්නේ කෙසේද යන්න පිළිබඳව දැනුවත් කිරීම වේ. |
| කාලය | : | පැය 1 යි |
| සැසිය පිළිබඳ විස්තරය | : | සැසිවාරයට පහත දෑ ඇතුළත් වනු ඇත: |

- ආදායම් මාර්ගයක් ලෙස ප්‍රේෂණ
- විගමණික ශ්‍රමිකයන් සහ විගමණික ශ්‍රමිකයන් ගේ පවුල්වලට ප්‍රේෂණවලට ඇති බලපෑම
- විවිධ මූල්‍ය ඉලක්ක හඳුනා ගැනීම

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- ආදායම් ප්‍රභවයක් ලෙස ප්‍රේෂණ පිළිබඳ සහ ජාතික ආර්ථිකයට ඇති බලපෑම සපයා ඇති විනිවිදක යොදා ගනිමින් කෙටි ඉදිරිපත් කිරීමක් කරන්න.
- කණ්ඩායම් දෙකකට සහභාගිවන්නන් වෙන් කරන්න.
- සෑම කණ්ඩායමකටම මාතෘකාවක් ලබා දී කණ්ඩායම් සාමාජිකයින්ට සාකච්ඡා කිරීමට සහ මාතෘකාව පිළිබඳ ඔවුන් දන්නා තොරතුරු ඉදිරිපත් කිරීමට ඉල්ලා සිටින්න. සෑම කණ්ඩායමක්ම පුද්ගල මට්ටමින්, පවුල් මට්ටමින්, ප්‍රජා මට්ටමින් සහ ජාතික මට්ටමින් කරන ලද දායකත්වය ඉදිරිපත් කළ යුතුය.
  - □ 1 කණ්ඩායම - තම පවුල සවිබල ගැන්වීමට /සුබසාධනය සඳහා විගමණික සේවකයන්ගේ දායකත්වය සාකච්ඡා කරන්න
  - □ 2 කණ්ඩායම - තම පුද්ගල වර්ධනය අනුව විගමණික සේවකයින් විසින් සපයන ලද දායකත්වය සාකච්ඡා කරන්න
- ඉදිරිපත් කිරීම් සාකච්ඡා කර සපයා ඇති කරුණු පිළිබඳ තොරතුරු එක් කරන්න.
- පවුල් සංවර්ධන සැලැස්මේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ කොටස හඳුන්වා දීම.

## සම්පත් පැකේජයට යොමුව:

- ආදායම් මාර්ගයක් ලෙස ප්‍රේෂණ සහ ජාතික ආර්ථිකයට ඇති බලපෑම පිළිබඳ අත් පත්‍රිකාව
- පවුල් සංවර්ධන සැලැස්ම

## අවශ්‍ය ද්‍රව්‍ය:

- ජාතික ආර්ථිකයට ප්‍රේෂණවල බලපෑම පිළිබඳ විනිවිදක
- විගමණිකයන්ට සහ එම පවුල් වලට ලැබෙන ආර්ථික බලපෑම පිළිබඳ කරුණු

| | |
|---|---|
| මාතෘකාව | : සැම අදියරකදීම විගමණික ශ්‍රමිකයන් මුහුණ දෙන සෞඛ්‍ය ගැටලු |
| සැසියේ අරමුණ | : විගමණික ශ්‍රමිකයන්ගේ සෞඛ්‍ය ගැටළු DO-FE ට හඳුන්වාදීම, ශ්‍රී ලංකා සංක්‍රමණ සෞඛ්‍ය ප්‍රතිපත්තිය හඳුන්වාදීම සහ විගමණික ප්‍රජාවට COVID-19 වසංගතයන් ඇති වූ බලපෑම් පිළිබඳව දැනුවත් කිරීම. |
| කාලය | : පැය 1 විනාඩි 30 යි |
| සැසිය පිළිබඳ විස්තරය | : මෙම සැසිවාරය විගමණික ශ්‍රමිකයන්ගේ සෞඛ්‍ය ගැටලු පිළිබඳව විගමණයේ අදියර තුනේදී ගැඹුරු සාකච්ඡාවකට ඉඩ සලසයි: පෙර පිටත්වීම, සේවයේ යෙදී සිටීම සහ ආපසු පැමිණීම සහ නැවත ඒකාබද්ධ වීම. සැසිවාරයට පහත සඳහන් දෑ ඇතුළත් වේ: ■ විගමණික ශ්‍රමිකයන් මුහුණ දෙන විවිධ සෞඛ්‍ය ගැටලු හඳුනා ගැනීම ■ කායික හා මානසික සෞඛ්‍ය ගැටළු යටතේ සෞඛ්‍ය ගැටළු වර්ගීකරණය ■ විගමණික ශ්‍රමිකයන්ගේ මෙරට සිටින පවුල්වල මානසික හා ශාරීරික සෞඛ්‍ය ගැටලු ■ බෝවන හා බෝනොවන රෝග පිළිබඳ තොරතුරු |

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- කණ්ඩායම් හතරකට සහභාගිවන්නන් වෙන් කරන්න. පහත සඳහන් කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමට එක් එක් කණ්ඩායමට පවරන්න.:
  - □ විගමණික ශ්‍රමිකයන් මුහුණ දෙන විවිධ සෞඛ්‍ය ගැටලු හඳුනා ගන්න.
  - □ කායික හා මානසික සෞඛ්‍ය ගැටලු යටතේ සෞඛ්‍ය ගැටලු වර්ග කරන්න.
  - □ විගමණික ශ්‍රමිකයන්ගේ මෙරට සිටින පවුල්වල මානසික හා ශාරීරික සෞඛ්‍ය ගැටලු හඳුනා ගැනීම.
  - □ විගමණික ශ්‍රමිකයන්ගේ පවුල් මුහුණ දෙන COVID-19 වසංගතයට අදාළ ප්‍රධාන ගැටලු හඳුනා ගන්න.
  - □ අවසන් සාකච්ඡා වටයේදී සපයා ඇති අත් පත්‍රිකා මත පදනම්ව, මඟහැරුණු තොරතුරු එක් කරන්න.
- ජාතික සංක්‍රමණ සෞඛ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ පසුබිම, ක්‍රියාවලිය සහ හැඳින්වීමක් පිළිබඳ විනිවිදක ඉදිරිපත් කිරීමක් කරන්න
- ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන ආසාදන (STI) සහ HIV/AIDS, උපකාරක සේවා සහ යොමු කිරීම්, පෙර පිටත්වීමේ අදියරේදී වෛද්‍ය පරීක්ෂණ සහ ඒවායේ නිර්දේශ, සේවයේ යෙදී සිටියදී සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය සහ නැවත ඒකාබද්ධ කිරීම පිළිබඳ අත් පත්‍රිකාව මත පදනම්ව දෘශ්‍ය ඉදිරිපත් කිරීමක් සහ සාකච්ඡාවක් සඳහා පහසුකම් සැලසීම.

**සම්පත් පැකේජයට යොමුව:**

- සෞඛ්‍ය ගැටලු සහ සංක්‍රමණ සෞඛ්‍යයේ විවිධ පැතිකඩ (ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදන (STI) සහ HIV/AIDS ඇතුළුවල උපකාරක සේවා සහ යොමු කිරීම්, පෙර පිටත්වීමේ අදියරේදී වෛද්‍ය පරීක්ෂණ සහ ඒවායේ ඇගැයීම්, සේවයේ යෙදී සිටියදී සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය සහ නැවත සමාජගත වීම හා ආපසු පැමිණීම), සංක්‍රමණ සෞඛ්‍ය ප්‍රතිපත්තිය 2012

**අවශ්‍ය ද්‍රව්‍ය**

- Flipcharts සහ markers
- විනිවිදක

| | |
|---|---|
| **මාතෘකාව** | : **විගමණික ශ්‍රමිකයා අවබෝධ කර ගැනීම** |
| **සැසියේ අරමුණ** | : අවදානම තක්සේරු කිරීම සඳහා හැඳින්වීමක් සැපයීම |
| **කාලය** | : පැය 1 යි |
| **සැසිය පිළිබඳ විස්තරය** | : මෙය මනෝ සමාජීය විශේෂඥයෙකු විසින් පහත සඳහන් කරුණු පිළිබඳ තොරතුරු සහ පුළුල් අවබෝධයක් ලබා දීම සඳහා පවත්වනු ලබන හඳුන්වාදීමේ සැසියකි. |

- විගමණික ශ්‍රමිකයා අවබෝධ කර ගැනීමේදී ප්‍රධාන ගැටළු
- ආපදා හඳුනා ගැනීම සහ අවබෝධ කර ගැනීම
- යහපැවැත්ම පිළිබඳ දර්ශක හඳුනා ගැනීම

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- ඉදිරිපත් කිරීම සහ ක්‍රියාකාරී සාකච්ඡාව

## සම්පත් පැකේජයට යොමුව:

- විගමණික ශ්‍රමිකයන්ගේ ප්‍රධාන ගැටළු, පීඩාව සහ යහපැවැත්ම අවබෝධ කර ගැනීම පිළිබඳ අත් පත්‍රිකා

## අවශ්‍යද්‍රව්‍ය:

- විනිවිදක

**මාතෘකාව** : **සන්නිවේදන කුසලතා හැඳින්වීම**

**සැසියේ අරමුණ** : සේවා සැපයීමේදී ඵලදායී සන්නිවේදනයේ වැදගත්කම අවබෝධ කර ගැනීම

**කාලය** : විනාඩි 45 යි

**සැසිය පිළිබඳ විස්තරය** : මෙම සැසිය සහභාගිවන්නන්ට පහත කරුණු පිළිබඳ අවබෝධයක් ලබා දෙනු ඇත:

- සන්නිවේදනය පිළිබඳ හැඳින්වීම
- සන්නිවේදනය යනු කුමක්ද?
- සන්නිවේදනය කරන්නේ කුමක්ද සහ කෙසේද?
- සන්නිවේදනය ක්‍රියා කරන්නේ කෙසේද?
- බාහිර

| | |
|---|---|
| මාතෘකාව | : **සුමිතුරු වීම පිළිබඳ හැඳින්වීම** |
| සැසියේ අරමුණ | : සහභාගිවන්නන්ට මිතුරු වීම සහ මිතුරෙකු වීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පිළිබඳ අවබෝධයක් ලබා දීම. |
| සැසිය පිළිබඳ විස්තරය | : මෙම සැසිය සහභාගිවන්නන්ට රැකියා අපේක්ෂාවෙන් සිටින ශ්‍රමිකයනට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට සුමිතුරෙකු වන්නේ කෙසේද යන්න පිළිබඳව ලබා දෙනු ඇත. සහභාගි වන්නන් සුමිතුරෙකුගේ නිර්වචනය සහ අත්‍යවශ්‍ය ගුණාංග සහ සුමිතුරෙකු වීමේ (Befriender) කුසලතා පිළිබඳ කෙටි අවබෝධයක් තේරුම් ගනු ඇත. |

ආවරණය වන ප්‍රදේශ වනුයේ:

- සුමිතුරෙකු වීම
- සුමිතුරු සු මිතුරියන් සඳහා අත්‍යවශ්‍ය ආකල්ප සහ උපකාරක සන්නිවේදන කුසලතා
- මිනිසුන් සමඟ වැඩ කිරීමේදී අත්‍යවශ්‍ය ආකල්ප
- එකින් එක (තනි පුද්ගල) සන්නිවේදනයේ මූලික කරුණු
- සවන්දීමේ කුසලතා, නියැලීම සහ කථන කුසලතා
- ආධාරකයේ පරාමිතීන් සහ මායිම්.
- අධීක්ෂණ වාර්තා තබා ගැනීම

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- ක්‍රියාකාරකම් සහ ඉදිරිපත් කිරීම්

## සම්පත් පැකේජයට යොමුව:

- අත් පත්‍රිකා

## අවශ්‍ය ද්‍රව්‍ය

- විනිවිදක

**මාතෘකාව** : **DO-FE හි භූමිකාවන් සහ වගකීම්**

**සැසියේ අරමුණ** : ඔවුන්ගේ භූමිකාව පිළිබඳ විධිමත් විස්තරයක් සමග DO-FE සැපයීම.

**කාලය** : විනාඩි 45 යි

**සැසිය පිළිබඳ විස්තරය** : මෙම සැසියේදී, විදේශ රැකියා අමාත්‍යාංශය විසින් සකස් කරන ලද DO-FE හි භූමිකාවන් දැක්වෙන DO-FE හි විධිමත් රැකියා විස්තරයක් සහභාගිවන්නන්ට ලබා දෙනු ඇත.

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- DO-FE හි කාර්ය භාරයන් දැක්වෙන DO-FE සඳහා විධිමත් රැකියා විස්තරයක් සෑම සහභාගිවන්නෙකුටම ලබා දෙන්න.
- කණ්ඩායම් සහභාගිවන්නන් 4 කට වෙන් කරන්න.
- එක් එක් කණ්ඩායමට රැකියා විස්තරයේ දක්වා ඇති භූමිකාවන් සංසන්දනය කිරීමට සහ සහභාගිවන්නන් විසින් අපේක්ෂා කරන සහ අමාත්‍යාංශය (විධිමත් ලේඛනය) විසින් අපේක්ෂා කරන පරිදි භූමිකාවන්හි කිසියම් වෙනස්කම් ඇත්නම් සාකච්ඡා කරන ලෙස ඉල්ලා සිටින්න.
- අවසන් රැස්වීමේදී, හමුවූ නොගැලපීම් ඉදිරිපත් කරන ලෙස කණ්ඩායම්වලින් ඉල්ලා සිටින්න.
- විදේශ රැකියා අමාත්‍යාංශයේ නිලධාරියෙකු මෙම වෙනස්කම් ගලපනු ඇති අතර ඒ අනුව රැකියා විස්තරය සකසනු ඇත.

## සම්පත් පැකේජයට යොමුව:

- DO-FE හි රැකියා විස්තරය (භූමිකාවන් පිළිබඳ කොටස)

## අවශ්‍ය ද්‍රව්‍ය:

- Flipcharts






| | |
|---|---|
| මාතෘකාව | : අවදානම තේරුම් ගැනීම |
| සැසියේ අරමුණ | : අවදානම පිළිබඳ හඳුන්වාදීමේ අවබෝධයක් ග්‍රහණය කර ගැනීම |
| කාලය | : පැය 1 යි |
| සැසිය පිළිබඳ විස්තරය | : මනෝ සමාජීය විශේෂඥයෙකු විසින් පවත්වනු ලබන මෙම සැසිවාරය, විගමණික සේවකයින්, ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සහ රැකබලා ගන්නන්ට ඇති අවදානම හඳුනා ගැනීම, අවබෝධ කර ගැනීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම පිළිබඳ අවබෝධයක් DO-FE වෙත ලබා දෙනු ඇත. |

සැසිය මගින් අවධානය යොමු කරඇති අංශ:

- විශේෂිත අවදානමක් සහිත විගමණිකයන්ට සහාය වීම
- වෙන්වීම සහ අහිමි වීම සංස්කෘතික ව්‍යාකූලත්වය
- විවිධ ආකාරයේ අපචාර
- පවුලේ සහයෝගය නොමැතිකම
- අසාධාරණ වරද සහ දොස්

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- ක්‍රීඩා සහ විශේෂිත ක්‍රියාකාරකම්

## සම්පත් පැකේජයට යොමුව:

- අවදානම් තත්ත්වය පිළිබඳ හැඳින්වීමක් පිළිබඳ අත් පත්‍රිකාව

## අවශ්‍ය ද්‍රව්‍ය:

- Flipcharts, cards, markers

| | |
|---|---|
| **මාතෘකාව** | : **සිද්ධි කළමනාකරණය** |
| **සැසියේ අරමුණ** | : විගමණික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල් ඔවුන් වෙත ගෙන එන සිද්ධි කළමනාකරණය කරන්නේ කෙසේද යන්න පිළිබඳ .DO-FE සඳහා පුළුල් අවබෝධයක් ලබා දීම. විශේෂයෙන්ම විගමණික ශ්‍රමික පවුල්වල දරුවන්ගේ ආරක්ෂාව / ළමා ආරක්ෂාව සඳහා සිද්ධි කළමනාකරණ ක්‍රමවේදය භාවිතය කෙරෙහි අවධානය යොමු කරයි. |
| **කාලය** | : පැය 1 විනාඩි 30 යි |
| **සැසිය පිළිබඳ විස්තරය** | : විදේශ රැකියා අමාත්‍යාංශය විසින් සිද්ධි කළමනාකරණයේ ප්‍රායෝගික අංශ පිළිබඳව මෙම සැසිවාරය පැවැත්වීමට නියමිතය. |

- සිද්ධියක් යනු කුමක්ද?
- සිද්ධියක් පටිගත කිරීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ පියවර
- ක්‍රියාකාරී සැලැස්ම සහ කාලසටහන පසු විපරම් කිරීම
- සිද්ධිය නිරාකරණය වන තෙක් සහ පසුව අඛණ්ඩ සේවා සැපයීම

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- විනිවිදක භාවිතයෙන් ඉදිරිපත් කිරීම
- ප්‍රශ්න සහ පිළිතුරු සඳහා ඉඩකඩ සහිත අන්තර්ක්‍රියාකාරී සාකච්ඡාවකින් අනතුරුව

## සම්පත් පැකේජයට යොමුව:

- සිද්ධි කළමනාකරණය පිළිබඳ අත් පත්‍රිකාව

### අවශ්‍ය ද්‍රව්‍ය:

- විනිවිදක

**මාතෘකාව** : රැකවරණ සැලැස්ම

**සැසියේ අරමුණ** : විගමණික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල් විසින් ඔවුන් වෙත ගෙන එන සිද්ධි කළමනාකරණය කරන්නේ කෙසේද යන්න පිළිබඳව DO-FE හට පුළුල් අවබෝධයක් ලබා දීම.

**කාලය** : පැය 1 විනාඩි 30 යි

**සැසිය පිළිබඳ විස්තරය** : පහත සඳහන් දෑ ඇතුළුව සිද්ධි කළමනාකරණයේ ප්‍රායෝගික පැති පිළිබඳව විදේශ රැකියා අමාත්‍යාංශය විසින් මෙම සැසිවාරය පැවැත්වීමට නියමිතය.

- රැකවරණ සැලැස්ම පැහැදිලි කිරීම
- සිද්ධි සම්මන්ත්‍රණ පවත්වන ආකාරය**ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය**

## ක්‍රියාකාරකම් සහ ක්‍රමවේදය:

- අන්තර්ක්‍රියාකාරී සැසියක් අනුගමනය කිරීම

## සම්පත් පැකේජයට යොමුව:

- රැකවරණ සැලැස්මකට උදාහරණයක්
- සිද්ධි සම්මන්ත්‍රණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර



| | | |
|---|---|---|
| **මාතෘකාව** | : | **ඉගෙනීම සහ ඇගයීම නැවත බැලීම** |
| **සැසියේ අරමුණ** | : | වැඩමුළුව අවසන් කිරීම |
| **කාලය** | : | විනාඩි 30 යි |
| **සැසිය පිළිබඳ විස්තරය** | : | මෙම සැසිය මඟින් වැඩමුළුව ඇගයීමට ලක් කිරීමට සහ අනෙකුත් පුහුණු සහ තොරතුරු අවශ්‍යතා හඳුනා ගැනීමට හැකියාව ලැබේ. |

## ක්‍රියාකාරකම් හා ක්‍රමවේදය

- පුහුණු වැඩසටහනේ ආවරණය වන සියලුම සැසිවල සාරාංශයක් සැපයීම.
- සහභාගීවන්නන්ට තව දුරටත් සහ/හෝ අමතර පුහුණුවක් අවශ්‍ය යැයි හැඟෙන ප්‍රදේශ දෙකක් හඳුනා ගැනීමට සහභාගීවන්නන්ගෙන් ඉල්ලා සිටින්න.
- ඇගයීම් පෝරමය බෙදා හැරීම සහ පෝරමය පුරවන ලෙස සහභාගිවන්නන්ගෙන් ඉල්ලා සිටින්න. මෙය තනි තනිව හෝ සහභාගිවන්නන් යුගල කිරීම මගින් සිදු කළ හැක.
- විධිමත් අවසන් ඉදිරිපත් කිරීමක් කරන්න.

### අවශ්‍ය ද්‍රව්‍ය:

- ඇගයීම් ආකෘති

# වැඩිදුර අධ්‍යයනය සඳහා

(මෙම සියළු ලේඛන පෙන් ඩ්‍රයිව් එකක බහා ඔබ වෙත ලබාදෙනු ඇත.)

1. ශ්‍රී ලංකාව සඳහා ජාතික ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්තිය -2008

2. 2012 ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතයින් සඳහා වූ සදාචාරාත්මක චර්යා ධර්ම සංග්‍රහය

3. සුරක්ෂිත ශ්‍රම සංක්‍රමණය පිළිබඳ මඟපෙන්වීම. -ILO

4. ගමනාන්ත රටවල විශේෂිත තොරතුරු පොත් පිංච.

5. ගමනාන්ත රටවල  රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවල කම්කරු සුබසාධන නිලධාරීන් සඳහා වූ ක්‍රියාකාරී අත්පොත 2013(2017 දී සංශෝධනය කරන ලදී)

6. ආපසු පැමිණීම සහ නැවත ඒකාබද්ධ කිරීම පිළිබඳ ILO අධ්‍යයනය

7. සංක්‍රමණික සේවකයින් සහ ඔවුන්ගේ පවුල් මුහුණ දෙන මනෝ සමාජීය ගැටළු අවබෝධ කර ගැනීම. SDC 2012

8. ජීවිත පරිවර්තනය :.නැවත පැමිණෙන ශ්‍රී ලාංකික කාන්තා සංක්‍රමජික ශ්‍රමිකයන්ට සවන් දීම

9. විගමනික ශ්‍රමිකයින් ආපසු පැමිණීම සහ නැවත සමාජගත කිරීම පිළිබඳ උප ප්‍රතිපත්තිය සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම.2015

10. සංක්‍රමණ සෞඛ්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2012

11. ශ්‍රී ලංකාවේ විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා මූල්‍ය සාක්ෂරතාවය

### වැඩිදුර අධ්‍යයනය සඳහා අත්පත්‍රිකා

1. විගමනික ශ්‍රමිකයින් සංවිධානය කිරීම

2. විගමණික ශ්‍රමිකයින්ගේ කුසලතා වර්ධනය

3. විගමනික ශ්‍රමිකයින් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රමවේද  ප්‍රවර්ධනය.

සටහන්

සටහන්

සටහන්